# වාර්ෂික වාර්තාව - 2023

# ஆண்டறிக்கை - 2023

# ANNUAL REPORT – 2023

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை**

**National Child Protection Authority**

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும்

சமூகவலுப்படுத்துகைஅமைச்சு

Ministry of Women, Child Affairs and Social Empowerment

# වාර්ෂික වාර්තාව

# 2023

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම

# මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම

## 2023 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| අනු අංකය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් | තනතුරු නාමය සහ පත්වූ කාලය | රාජකාරී කරන ස්ථානයේ ලිපිනය |
|---|---|---|---|
| 01 | උදයකුමාර අමරසිංහ මහතා | සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>(2021.11.22) | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ |
| 02 | නීතිඥ සුජාතා අලහප්පෙරුම මහත්මිය | නියෝජ්‍ය සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>(2019.12.24) | විශ්‍රාමික මහාධිකරණ විනිසුරු |
| 03 | වෛද්‍ය ස්වර්ණා විජේතුංග මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2020.01.22) | ජ්‍යෙෂ්ඨ මනෝවෛද්‍ය විශේෂඥ, (ළමා හා යෞවන)<br>රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල |
| 04 | වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2022.07.28) | අධිකරණ වෛද්‍ය,<br>විශ්‍රාමික |
| 05 | සුසන්ත බාලපටබැඳි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2020.06.15) | අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12 |
| 06 | නීතිඥ අජිත් රෝහණ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2021.07.21) | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය, දකුණු පළාත |
| 07 | නීතිඥ අසංක කරවිට මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2023.04.18) | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,<br>පුහුණු හා උසස් පුහුණු කාර්යාලය, අපරාධ වාර්තා කොට්ඨාසය, මෙට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07 |
| 08 | අශෝකා අලවත්ත මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2021.07.21) | අමාත්‍යාංශ ලේකම්,<br>විශ්‍රාමික |
| 09 | ආචාර්ය පවිත්‍රා ගොඩමුන්නේ මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2021.07.15<br>2022.07.28) | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය |
| 10 | ආචාර්ය කපිල බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2020.01.22<br>2021.07.15) | පීඨාධිපති,<br>අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ 07 |
| 11 | බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2020.10.19) | කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ 06 |
| 12 | ආර්.කේ.ජයලත් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>(2023.04.08) | අධ්‍යක්ෂ,<br>මුදල් අමාත්‍යාංශය,<br>ලෝටස් පාර, කොළඹ 01 |

| | | | |
|---|---|---|---|
| 13 | නාමල් ඉන්දික ලියනගේ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2023.01.26) | කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල |
| 14 | එම්.එච්.පී.බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික නියෝජිත (ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මඟින් ඒ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කර්යය සඳහා සංස්ථාපනය කරනු ලැබූ කමිටුවේ සභාපතිවරයා නියෝජනය කිරීම ) (2020.01.22) | අතිරේක ලේකම් (පාලන), කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, බත්තරමුල්ල |
| 15 | වෛද්‍ය සේනක ගුණතිලක මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.01.22 2022.07.28) | ළමා රෝග විශේෂඥ, විශ්‍රාමික |

## 2023 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

| අනු අංකය | මූල මණ්ඩල සාමාජිකයන්ගේ නම් | තනතුරු නාමය සහ පත්වූ කාලය | රාජකාරී කරන ස්ථානයේ ලිපිනය |
|---|---|---|---|
| 01 | ඒ.එම්.ඩී. සුමනසේන මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.05.26) | කොමසාරිස්, ළමා හා කාන්තා අංශය, කම්කරු දෙපාර්තමේන්තුව,කොළඹ 06 |
| 02 | වෛද්‍ය එච්.එස්.ආර්.පෙරේරා මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.06.19) | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, කොළඹ 10 |
| 03 | කේ.පී.එන්.දේවප්‍රිය මහතා | මූල මණ්ඩල සාමාජික (2020.06.11) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන), අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල |
| 04 | රෝෂිණී හෙට්ටිගේ මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.06.09) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති), අධිකරණ අමාත්‍යාංශය, කොළඹ 12 |
| 05 | එම්.සී.එස්. දේවසුරේන්ද්‍ර මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.05.26) | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), තොරතුරු තාක්ෂණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, පොල්හේන්ගොඩ, කොළඹ 05 |
| 06 | වී.සී.ද සිල්වා මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2021.01.22) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, යුනියන් පෙදෙස, කොළඹ 02 |
| 07 | වෛද්‍ය ලාල් පනාපිටිය මහතා | මූල මණ්ඩල සාමාජික (2021.03.17) | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, කොළඹ 10 |
| 08 | හසිනි පල්ලාවල මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.05.20) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන), ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ |
| 09 | එම්.ඩී.ජේ.සී.මුරගේ මහතා | මූල මණ්ඩල සාමාජික 2022.10.13 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවාහන හා පාර්ලිමේන්තු කටයුතු), අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල |

# පටුන



| අන්තර්ගතය | පිටු සංඛ්‍යාව |
|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමාගේ සමාලෝචනය | 1.- 1 |
| හැඳින්වීම | 2 - 3 |
| ප්‍රධාන කාර්යය | 3 - 4 |
| 2023 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන සටහන | 4 - 4 |
| 2023 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය | 5 – 5 |
| 2023 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු | 5 – 7 |
| මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධන විශ්ලේෂණය | 7 – 8 |
| **ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2023** | |
| ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම | 8 – 9 |
| ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ නීති පද්ධතිය ශක්තිමත් කිරීම | 9 – 11 |
| ළමා අපචාර පිළිබඳ අපරාධ නඩු කටයුතු නියාමනය කිරීම. (නියමු වැඩසටහන) | 11 - 12 |
| ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම | 12 – 12 |
| ජාතික දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම | 12 – 12 |
| 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය | 13 – 13 |
| ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි | 13 – 17 |
| පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන | 17 – 17 |
| ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ “ශිෂ්‍ය තානාපති” ජාතික වැඩසටහන | 18 – 18 |
| විශ්ව විද්‍යාල සිසුන් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ “විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති ” ජාතික වැඩසටහන | 18 – 18 |
| හදිසි ආපදා අවස්ථාවලදී ළමා ආරක්ෂාව සහ ළමුන් සඳහා හදිසි සහන වැඩසටහන | 19 – 19 |
| වින්දිත, ආන්තික, අවදානම් සහගත, අවදානමට ලක්විය හැකි ළමුන් සහ ළමා අපයෝජනයට ගොදුරු වූ ළමුන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම | 19 – 19 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීමේ ජාතික වැඩසටහන | 19 – 19 |
| ළමා අපයෝජන හා සම්බන්ධ සියලු අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම | 19 – 20 |
| ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 20 – 20 |
| ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන | 20 – 20 |
| ළමා ආරක්ෂාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු විදුහල්වල හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන | 21 – 21 |
| ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය ව්‍යාපාර, තොරතුරු, අධ්‍යාපන හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය, උත්සව සහ දින සැමරුම්, ප්‍රදර්ශන සහ ජංගම සේවා, NCPA නිල වෙබ් අඩවිය, මුහුණු පොත, YouTube සහ twitter පවත්වාගෙන යාම සම්බන්ධ සන්නිවේදන වැඩසටහන් | 21 – 22 |
| විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු කටයුතු පිළිබඳ නියාමනය, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් නියාමන කටයුතු සිදුකිරීම | 22 – 22 |

| | |
|---|---|
| ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම | 22 – 23 |
| ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය උපකාර සේවාව | 23 – 23 |
| ළමා අපයෝජන ප්‍රතිසාධන විෂයමාලාව | 24 – 24 |
| නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | 24 – 24 |
| විගමනික සේවකයින්ගේ ළමුන් සියලු ආකාරයේ සාහසිකත්වයන්ගෙන් ආරක්ෂාවීම තහවුරු කිරීම සඳහා "පවුල් හමු" තාක්ෂණික මෙවලම හඳුන්වා දීමේ ජාතික වැඩසටහන | 24 – 24 |
| වෙරළබඩ කලාපය ආශ්‍රිත ගම්මානවල ජීවත්වන ළමුන්ගේ යහපැවැත්ම නඟා සිටුවීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ වැඩසටහන | 24 – 25 |
| වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වෙසෙන ළමුන්ගේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ ප්‍රජා වැඩසටහන | 25 – 25 |
| ආගමික පූජ්‍ය, පූජක ප්‍රසාදීන් දැනුවත් කිරීමේ නියමු වැඩසටහන | 26 – 26 |
| ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන | 26 – 26 |
| විශේෂ පොලිස් විමර්ශන | 26 – 27 |
| ඡායාරූප එකතුව | 28 – 30 |
| වාර්ෂික ගිණුම් | 31 – 48 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 49 - 56 |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමාගේ සමාලෝචනය

ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි කාර්යය සඳහා සහ සියලු ආකාරයේ වූ ළමා අපයෝජනවලට එරෙහි වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීම සඳහා 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවන ලදී.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 වගන්තියට අනුව අධිකාරියට නියමිත වූ කර්තව්‍ය සඳහන් කර ඇත. එහි (අ) වගන්තිය ප්‍රකාරව ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2019 වර්ෂයේ දී සකස් කර අවසන් කරන ලදී. ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ නීති පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා 2023 වර්ෂයේදී කැපකරු මාපිය රැකවරණය සම්බන්ධ නීති සංශෝධනය සහ ළමා ශාරීරික දණ්ඩනය සම්බන්ධ නීති සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කාර්යයන් සිදුකර ඇත. ලිංගික අපයෝජනය හේතුකොට ගර්භනීභාවයට පත්වන ගැහැණු ළමයින් සඳහා වෛද්‍ය හේතු මත එකී ගර්භනීභාවය අවසන් කිරීම, පොදු ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යන නිලධාරීන් විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් වන නීතියක්, රෙගුලාසියක් හෝ මාර්ගෝපදේශයක් වේදැයි සොයා බැලීම සඳහා කටයුතු කිරීම, ළමා අපයෝජන වැරදි සඳහා වැරදිකරුවන්වූ තැනැත්තන් ළමයින් සමඟ රාජකාරී කිරීම වළක්වාලීම සඳහා නෛතික ප්‍රතිපාදන හඳුන්වාදීම සම්බන්ධයෙන් මූලික කටයුතු සිදුකිරීම සඳහා කාර්යයන් මෙහෙයවා ඇත.

2023 වර්ෂයේදීත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා අපයෝජන වළක්වා ගැනීමට දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රතිපාදන සහිතව සහ රහිතව පැවැත්වීම සිදුකර ඇත. එමෙන්ම ළමා අපයෝජනය හේතුවෙන් වින්දිතභාවයට පත්වූ ළමුන් නැවත සමාජගත කිරීමට අවශ්‍ය මැදිහත්කරණයන් සිදුකර ඇත.

2023 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලදී. සමස්තයක් වශයෙන් ගත් කළ 2023 වර්ෂය තුළ ද ළමා ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කළ සෑම අංශයකින්ම සැලකිය යුතු කාර්ය සාධනයක් අත්කර ගැනීමට හැකි වූ බව සඳහන් කළ හැකිය. මේ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයෙන්, රේඛීය අමාත්‍යාංශයෙන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය අගය කරමි.

උදයකුමාර අමරසිංහ
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## හැඳින්වීම

වර්ෂ 1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, විශ්ව ප්‍රකාශනයක් ලෙස සම්මත කර ගන්නා ලදී. මෙම සම්මුතිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමඟින් ලොව සෑම ළමයෙකුටම හිමිවිය යුතු අයිතිවාසිකම් මෙන්ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්මුතිය සම්මත කර ගැනීමෙන් පසුව එම කාලය තුළ පැවති සමාජ තත්ත්වය විමර්ශනය කිරීමේ දී, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය, ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම සහ ජාත්‍යන්තර වශයෙන් රහසිගතව සිදු කරන ළමා වෙළඳාම ඉහළ යාම සම්බන්ධයෙන් දැඩි ලෙස සැලකිලිමත් වීම සිදු කරන ලදී. එමෙන්ම ආයුධ සන්නද්ධ අරගලයන් හි දී ළමයින් බලහත්කාරයෙන් යුධ සේවාවෙහි යෙදවීම හෝ බඳවා ගැනීම අන්තර් ජාතික අපරාධයක් ලෙස දැක්වීම ද හඳුනාගන්නා ලදී. මෙම කරුණු සියල්ල කෙරෙහි ම දැඩි ලෙස අවධානය යොමු කරමින් වර්ෂ 2000දී ළමා අයිතිවාසිකම් සම්මුතිය සඳහා ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම සම්බන්ධයෙන් අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදී.

ශ්‍රී ලංකා රජය ද එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා 1990 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදී. 1991 ජූලි 12 වන දින මෙම සම්මුතිය අනුමත විය. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහි දී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරි බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 1998 අගෝස්තු මාසයේදී අධිකරණ ඇමති විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. 1998 නොවැම්බර් මාසයේදී මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී ඒකමතිකව සම්මත විය. ඒ අනුව 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. 1999 ජූනි මාසයේදී අධිකාරියේ ප්‍රථම සභාපති හා පාලක සභාව පත් කිරීමෙන් පසුව අධිකාරිය ක්‍රියාත්මක විය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිට වර්තමානය දක්වාම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන් හි දී ඊට අදාළ නිසි පියවර ගැනීම හා වින්දිත ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිතභාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත මඟින්ද අධිකාරිය වෙත බලතල හිමිව පවතියි. තවද 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මඟින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වූ විට අධිකාරියට වාර්තා වීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් වීම සිදුකළ හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනමින් සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. මෙම දුරකථන සේවය ආරම්භයත් සමඟ සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන සිද්ධි වාර්තා වීම ක්‍රම ක්‍රමයෙන් ඉහළ අගයක් ගැනීම දක්නට ලැබුණි. අද වන විට ලංකාවේ සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන පිළිබඳ තොරතුරු සහ සිදුවීම් මෙම සේවය හරහා වාර්තා වන අතර, ළමුන් සඳහා උපදේශන සේවාවන් ද මෙමඟින් ලබාගත හැකිය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූලික කාර්යයක් වන "ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" (National Policy on Child Protection) සඳහා 2019.10.29 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. එසේම මේ වන විට එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව "ළමා ආරක්ෂණය පිළිබඳ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම" පිළියෙල කිරීමේ කටයුතු අධිකාරිය විසින් සිදුකරයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව වෙනුවෙන් 2023 වසර තුළදීත් ජාතික ක්‍රියාකාරී සැලසුම්වලට අදාළ කාර්යයන් සිදුකර ඇත.

## ප්‍රධාන කාර්යයන්

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්යභාරයක් පැවරී ඇත. එම කාර්යභාරය පහත සඳහන් කර ඇත.(වගන්ති 14 ප්‍රකාරව)

(අ) ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා රජයට උපදෙස් දීම.

(ආ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.

(ඇ) එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.

(ඈ) අපයෝජනවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.

(ඉ) ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවලදී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.

(ඊ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.

(උ) සියලු ආකාර ළමා අපයෝජනවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.

(ඌ) ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.

(එ) සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැලකිල්ලට ගතයුතු කරුණු පිළිබඳව යොමුවීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුභසිද්ධිය සඳහා පියවර ගැනීම ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුළු කර ගැනීම.

(ඒ) අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.

(ඔ) ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම.

(ඕ) ළමා අපයෝජනවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහාය වීම.

(ක) ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම.

(ග) අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.

(ච) ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.


(ජ) ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම.

(ට) ළමා අපයෝජනවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමඟ සංවාදයෙහි යෙදීම.

(ඩ) ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.

(ණ) සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ රජයන් සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

**2023 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන සටහන**



## 2023 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පහත සඳහන් අංශ ක්‍රියාත්මක වේ.

1 සභාපති හා නියෝජ්‍ය සභාපති කාර්යාලය
2 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
3 පරිපාලන හා මානව සම්පත් අංශය
4 මූල්‍ය අංශය
5 සැලසුම් හා තොරතුරු අංශය
    5.1 සැලසුම් හා නියාමන ඒකකය
    5.2 තොරතුරු හා මාධ්‍ය ඒකකය
        - පුස්තකාලය
6 පර්යේෂණ හා සංවර්ධන අංශය
7 මනෝසමාජීය අංශය
8 නීති අංශය
9 නීතිය බලාත්මක කිරීමේ අංශය
    9.1 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය
    9.2 මධ්‍යම ලේඛනාගාරය
    9.3 වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය
        9.3.1 වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය - රාගම
        9.3.2 වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය - කරාපිටිය
    9.4 අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය
    9.5 විමර්ශන ඒකකය
10 අභ්‍යන්තර විගණන අංශය
10 විශේෂ පොලිස් විමර්ශන ඒකකය

## 2023 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු


| අංකය | තනතුර | වැටුප් - කේත අංකය | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | HM -2-1 | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | HM -1-3 | 01 | - | 01 |
| 03 | අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත් | HM -1-1 | 01 | 01 | - |
| 04 | අධ්‍යක්ෂ - මූල්‍ය | HM -1-1 | 01 | - | 01 |
| 05 | අධ්‍යක්ෂ - නීති | HM -1-1 | 01 | 01 | - |
| 06 | සායනික මනෝවිද්‍යාඥ | HM -1-1 | 01 | - | 01 |
| 07 | අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු | HM -1-1 | 01 | 01 | - |
| 08 | අධ්‍යක්ෂ - වැඩසටහන් | HM -1-1 | 01 | 01 | - |
| 09 | අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | HM -1-1 | 01 | 01 | - |
| 10 | සහකාර අධ්‍යක්ෂ - පරිපාලන | MM -1-1 | 01 | 01 | - |
| 11 | සහකාර අධ්‍යක්ෂ - නීති | MM -1-1 | 01 | - | 01 |
| 12 | සහකාර අධ්‍යක්ෂ - වැඩසටහන් (මුදල් අමාත්‍යාංශයට මුදා හැර ඇත) | MM - 1-1 | 01 | 01 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | සහකාර අධ්‍යක්ෂ - මනෝවිද්‍යා | MM -1-1 | 01 | 01 | - |
| 14 | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා නියාමන | MM -1-1 | 01 | 01 | - |
| 15 | සහකාර අධ්‍යක්ෂ - මාධ්‍ය හා තොරතුරු | MM -1-1 | 01 | 01 | - |
| 16 | සහකාර අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | MM -1-1 | 01 | 01 | - |
| 17 | ගණකාධිකාරී | MM -1-1 | 01 | 01 | - |
| 18 | අභ්‍යන්තර විගණක | MM -1-1 | 01 | 01 | - |
| 19 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | JM – 1-1 | 01 | 01 | - |
| 20 | පරිපාලන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 21 | වැඩසටහන් නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 22 | ගිණුම් නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 23 | විමර්ශන නිලධාරි | JM – 1-1 | 02 | 01 | 01 |
| 24 | මාධ්‍ය හා තොරතුරු නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 25 | සැලසුම් හා නියාමන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 26 | පර්යේෂණ හා සුබසාධන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 27 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ නිලධාරී | JM – 1-1 | 01 | 01 | - |
| 28 | මනෝසමාජීය නිලධාරී | JM – 1-1 | 01 | - | 01 |
| 29 | සයිබර් අපරාධ විශ්ලේෂක | JM – 1-1 | 01 | - | 01 |
| 30 | සයිබර් විමර්ශන නිලධාරී | JM – 1-1 | 01 | - | 01 |
| 31 | තොරතුරු තාක්ෂණ නිලධාරී | JM – 1-1 | 01 | - | 01 |
| 32 | නීතිය බලාත්මක කිරීමේ නිලධාරී | JM – 1-1 | 01 | - | 01 |
| 33 | පරිවර්තක - ඉංග්‍රීසි | MA - 4 | 01 | - | 01 |
| 34 | පරිවර්තක - දමිළ | MA - 4 | 01 | - | 01 |
| 35 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 25 | 18 | 07 |
| 36 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි | MA - 3 | 25 | 14 | 11 |
| 37 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 369 | 218 | 150 |
| 38 | ළමා වින්දිත ආරක්ෂක නිලධාරි | MA - 3 | 01 | - | 01 |
| 39 | පරිපාලන සහකාර | MA - 3 | 01 | 01 | - |
| 40 | ගිණුම් සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 41 | මාධ්‍ය සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 42 | පුස්තකාලයාධිපති | MA - 3 | 01 | - | 01 |
| 43 | සැලසුම් සහකාර | MA - 3 | 01 | - | 01 |
| 44 | නීති සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 45 | විමර්ශන සහකාර | MA - 3 | 06 | 02 | 04 |
| 46 | උපදේශන සහකාර | MA - 3 | 15 | 04 | 11 |
| 47 | වැඩසටහන් සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 48 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර | MA - 3 | 10 | 02 | 08 |
| 49 | අන්තර්ජාල ආවේක්ෂණ සහකාර | MA - 3 | 02 | 01 | 01 |
| 50 | චිකිත්සක | MA - 3 | 03 | 01 | 02 |
| 51 | වීඩියෝ තාක්ෂණික සහකාර | MA – 2-1 | 10 | 02 | 08 |
| 52 | කළමණාකරන සහකාර (තාක්ෂණික) | MA – 2-1 | 15 | 10 | 05 |
| 53 | තොරතුරු තාක්ෂණික සහකාර | MA – 2-1 | 02 | 01 | 01 |
| 54 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) | MA – 1-1 | 32 | 15 | 17 |
| 55 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) යතුරුලියන කටයුතු (සිංහල මාධ්‍ය) | MA – 1-1 | 10 | 02 | 08 |
| 56 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) යතුරුලියන කටයුතු (දමිළ මාධ්‍ය) | MA – 1-1 | 10 | 02 | 08 |


| | | | | | |
|---|---|---|---|---|---|
| 57 | කළමණාකරන සහකාර - (තාක්ෂණික නොවන) සෝදුපත් බැලීමේ කටයුතු (සිංහල මාධ්‍ය) | MA – 1-1 | 10 | 02 | 08 |
| 58 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) සෝදුපත් බැලීමේ කටයුතු (දමිළ මාධ්‍ය) | MA – 1-1 | 10 | - | 10 |
| 59 | රියදුරු | PL 3 | 07 | 04 | 03 |
| 60 | පණිවිඩකරු | PL-1 | 01 | 01 | - |
| 61 | කාර්යාල කාර්ය සහයක | PL-1 | 03 | 03 | - |
| 62 | කාර්යාල කම්කරු | PL-1 | 02 | 01 | 01 |
| මුළු සංඛ්‍යාව | | | **618** | **331** | **287** |

## මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධන විශ්ලේෂණය

2023 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම යටතේ ක්‍රියාත්මක විය. 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 40කි.



**2023 - ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළව එක් එක් අංශයන්ගේ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විශ්ලේෂණය**




## ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2023

### ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සහ ළමා කටයුතු ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණු වේ. මෙහිදී මුල් ළමා විය සංවර්ධන නිලධාරීන්, පරිවාස නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, වනිතා සංවර්ධන නිලධාරීන් සහ උපදේශන නිලධාරීන් දැනුවත් කිරීම සිදුකරයි. 2023 වර්ෂයේදී වැඩසටහන් 25ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා 2023 දී සහභාගී වූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1218 දෙනෙකි. සම්පත් සංචිතයේ නිලධාරීන් සඳහා වැඩමුළු 02ක් මාර්ගගතව පවත්වන ලදී. නිලධාරීන් 172ක් සහභාගී විය.

තවද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් විසින් ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රතිපාදන රහිතව සිදුකර ඇත. එම වැඩසටහන් 12ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා 2023 දී සහභාගී වූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 703 දෙනෙකි.

ප්‍රතිපාදන සහිතව සිදු කරන ලද වැඩසටහන් පහත සඳහන් කර ඇත.

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර | ගාල්ල | මාතර | හම්බන්තොට | බදුල්ල | මොණරාගල | ත්‍රිකුණාමලය | මඩකලපුව | අම්පාර | පුත්තලම | කුරුණෑගල | මහනුවර | මාතලේ | නුවරඑළිය | අනුරාධපුර | පොළොන්නරුව | කෑගල්ල | රත්නපුරය | යාපනය | කිලිනොච්චිය | මුලතිව් | මන්නාරම | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 49 | 45 | 45 | 45 | 92 | 54 | 55 | 57 | 45 | 50 | 61 | 45 | 56 | 60 | 65 | 50 | 50 | 33 | 50 | 54 | 39 | 25 | 40 | 25 | 28 |

ප්‍රතිපාදන රහිතව සිදු කරන ලද වැඩසටහන් පහත සඳහන් කර ඇත.

| දිස්ත්‍රික්කය | ගම්පහ | ගාල්ල | මාතර | මඩකලපුව | මහනුවර | අනුරාධපුරය | කෑගල්ල | මන්නාරම |
|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 03 | 02 | 01 | 01 | 02 | 01 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 45 | 150 | 175 | 65 | 19 | 43 | 121 | 85 |

## ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ නීති පද්ධතිය ශක්තිමත් කිරීම.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (ඊ) වගන්තිය ප්‍රකාරව ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම මඟින් කාලානුරූපීව ළමා ආරක්ෂාව තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම මෙහි මූලික අරමුණ වේ.

අධිකරණ නියෝග අනුව කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත කරන ලද ඉල්ලීම් අනුව මෙන්ම ළමා ආරක්ෂාව සම්බන්ධ කාලීන අවශ්‍යතා අනුව එකී නීතිමය, පරිපාලනමය සහ වෙනත් සංශෝධන අවශ්‍ය වන ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම සිදුකරන ලදී.

සංශෝධන නිර්දේශ කිරීම සඳහා ළමා ආරක්ෂාව හා බැඳුණු විෂයය ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් සමන්විත විද්වත් කමිටු පත්කළ අතර 2023 වසරේදී නීතිමය, පරිපාලනමය හා වෙනත් සංශෝධන සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ කමිටු විෂයය ක්ෂේත්‍රයන් අනුව පහත පරිදි වේ.

2023 වර්ෂයේදී නීති ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද කමිටු විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | කමිටුවේ විෂයය | ගන්නා ලද තීරණ |
|---|---|---|
| 01 | බාලවයස්කාර ළමුන් සඳහා ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීම පිළිබඳ නීතිමය තත්ත්වය - කලවංචිකුඩි මහේස්ත්‍රාත් අධිකරණ නියෝගය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද අනු කමිටුව රැස්වී සාකච්ඡා කරන ලද අතර නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් මෙම කරුණ පිළිබඳව අධිකාරියේ ස්ථාවරය කලවංචිකුඩි මහේස්ත්‍රාත් අධිකරණය වෙත දන්වන ලදී. |
| 02 | සංචාරක ක්ෂේත්‍රය හා ළමා ආරක්ෂාව | ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සංවරණ හා සංචාරක ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමඟ සංවාදයේ යෙදීම සඳහා රාජ්‍ය, සංවරණ හා සංචාරක ක්ෂේත්‍රයේ පෞද්ගලික ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ වෙන් වෙන්ව සහ එකතුවත් සාකච්ඡා සිදුකරන ලදී. පුහුණුකරුවන් පුහුණු කිරීම සිදුකරන ලදී. |
| 03 | ළමා අපයෝජන සඳහා වරදකරුවකු වූ තැනැත්තන් ළමයින් සමඟ කටයුතු කිරීම වළකාලීමට ක්‍රමවේද හඳුන්වා දීම. | 230 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2023.09.21 වන දින ගත් තීරණය පරිදි ආදාළ ආයතන වෙතින් නාම යෝජනා කැඳවන ලදී. ළමා අපයෝජන සඳහා වරදකරුවකු වූ තැනැත්තන් ළමයින් සමඟ කටයුතු කිරීම වළකාලීමට ක්‍රමවේද හඳුන්වා දීමේ කමිටුව රැස්වී අදාළ විෂයට අදාළ ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා ආරම්භ කරන ලදී. |
| 04 | අනන්‍යතාවය හෙළිකිරීමකින් තොරව අතහැර දමා යන බිළිඳුන් ආරක්ෂිතව භාර ගැනීමේ ක්‍රමවේදය සඳහා නීතිය | නීති අනු කමිටුව විෂයගත කරුණ දීර්ඝව සාකච්ඡා කරන ලදී. දණ්ඩ නීති සංග්‍රහයේ 308 වගන්තිය සංශෝධනය කිරීමකින් තොරව, පවත්නා නීතිමය රාමුව තුළ බිළිඳුන් භාරගැනීමේ කවුළු පිහිටුවිය හැකි බවට නිර්දේශ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය වෙත ලබාදෙන ලදී. |
| 05 | කායික දණ්ඩන නීති සංශෝධනය | කායික දණ්ඩනය සම්බන්ධයෙන් වූ නීති සංශෝධන කමිටුව කෙටුම්පත් කළ නීතිය ළමා ආරක්ෂාවේ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර අදහස් හා යෝජනා ලබාගන්නා ලදී. නීති සංශෝධනය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍යවරයාට යොමුකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. |
| 06 | කැපකරු මා පිය රැකවරණය නීති සම්පාදනය | කැපකරු මා පිය රැකවරණය සඳහා නව නීති සම්පාදනයට අදාළ සංක්ෂිප්ත කරන ලද සංකල්ප පත්‍රිකාව හා අමාත්‍ය මණ්ඩල සංදේශය කාන්තා, ළමා |

| | | |
|---|---|---|
| | | කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා යොමුකරන ලදී. |
| 07 | පොදු ප්‍රවාහන සේවා භාවිතා කරමින් තනිවම ගමන් කරන ළමයාගේ ආරක්ෂාව පිළිබඳව ඇති නෛතික ප්‍රතිපාදන | ප්‍රවාහන සේවා සපයන රජයේ ආයතන නියෝජිතයින් කැඳවා සාකච්ඡා කරන ලදී. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් එක් ඒක් රාජ්‍ය ආයතනයේ දායකත්වය හඳුනාගන්නා ලදී. විෂයට අදාළ නෛතික ප්‍රතිපාදන සම්බන්ධයෙන් හඳුනාගන්නා ලදී. කලවංචිකුඩි මහේස්ත්‍රාත් අධිකරණය වෙත අධිකාරියේ ස්ථාවරය වාර්තා කරන ලදී. |
| 08 | ළමා වින්දිතයින්ට වෛද්‍ය හේතූන් මත ගර්භනීභාවය අවසන් කිරීමට අවසරය | ළමා වින්දිතයින්ට වෛද්‍ය හේතූන් මත ගර්භනීභාවය අවසන් කිරීමට 2016 දෙසැම්බර් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදුන් එහෙත් අදාළ නීති සංශෝධනය නොවූ කරුණ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස අධිකරණ අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරන ලදී. |
| 09 | ළමා අපයෝජන නඩු කටයුතු කඩිනම් කිරීම සම්බන්ධ යෝජනා ඉදිරිපත් කිරීම | 232 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2023.11.23 ගත් තීරණය පරිදි ළමා අපයෝජන නඩු කටයුතු කඩිනම් කිරීම සම්බන්ධ යෝජනා ඉදිරිපත් කිරීමේ කමිටුව සඳහා අදාළ ආයතන වෙතින් නාමයෝජනා කැඳවන ලදී. |
| 10 | ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සංයුක්ත පනතක් සකස් කිරීම | ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සංයුක්ත පනතක් සකස් කිරීම පිළිබඳ කමිටුවේ දෙවන රැස්වීම් වාරය පැවැත්විය. කමිටු සාමාජිකයින් සංයුක්ත පනත සඳහා යෝජනා නිර්දේශ ලබාදෙන ලදී. සියළු තොරතුරු ගොනු ගත කොට නීතියේ ලුහුඬුතා සහ සංශෝධනය සඳහා යෝජනා ඇතුළත් ලේඛනය පිළියෙල කරන ලදී. ඉදිරි කටයුතු සඳහා ලේඛනය කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී. |

## ළමා අපචාර පිළිබඳ අපරාධ නඩු කටයුතු නියාමනය කිරීම. (නියමු වැඩසටහන)

ළමා අපයෝජන හා සම්බන්ධ නඩු නියාමනය කිරීමේ කටයුතු, අධිකාරියට 14 (ග) යටතේ ලැබී නීති අංශය වෙත යොමුවන ඒ සම්බන්ධ පැමිණිලි හරහා සිදුවූවකි. මෙලෙස යොමුවන පැමිණිල්ලේ නඩුවේ විභාගය ප්‍රමාද වීම වැළැක්වීමට අදාළ වන සාක්ෂිකරුට සහාය සහ රැකවරණය සැලසීම (උසාවියේදී / පාසලේදී / ගෙදරදී), නීතිපති උපදෙස් කඩිනම් කිරීම, විමර්ශනයට අදාළ ලේඛන රැස්කිරීමට සහාය දීම, නීතිඥ සහාය / නීති උපදෙස් සැලසීම ආදි සියල්ල මෙම නියාමන ක්‍රමවේදයට ඇතුළත් විය. පැමිණිල්ලක් ලෙස ලැබෙන තොරතුරක් ආශ්‍රයෙන් ළමා අපයෝජන නඩු විභාග කඩිනම් කිරීමෙන් නියාමනය කිරීමට පියවර ගන්නා ලදී. ළමා අපයෝජන අපරාධ නඩු කටයුතු නියාමනය ලෙස පනතේ 14 (ඌ) බලාත්මක කිරීම සඳහා 2023 දී නීති අංශ පැමිණිලි 40 ක් සම්බන්ධයෙන් මැදිහත්කරණය මෙහි පහත දැක්වේ. (එක නඩුවකට අදාළව නියාමන කිහිපයක් අනුගමනය කර ඇති බව සලකන්න)

| | | |
|---|---|---|
| 01. | අධිකරණ වෛද්‍ය වාර්තා | 02 |
| 02. | පොලීසිය සම්බන්ධීකරණය | 03 |
| 03. | නීතිපති සම්බන්ධීකරණය | 19 |
| 04. | වින්දිත රැකවරණය | 04 |
| 05. | අධ්‍යාපන සහය | 08 |
| 06. | අයිතිවාසිකම් සඳහා මැදිහත්කරණ | 03 |
| 07. | වින්දිත සහය | 08 |
| 08. | බුද්ධි තොරතුරු | 01 |

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විමර්ශනය කරන ලදුව නීතිපති උපදෙස් සඳහා යොමුකළ අපරාධ විමර්ශන උදෘත ගොනු සම්බන්ධයෙන් නීති අංශය සිදුකළ ගොනු පරීක්ෂාව (නියාමනය) - 2023 වර්ෂය උදෘත ගොනු 18

## ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරිම.

සුරක්ෂිත, දයාන්විත පරිසරයක් තුළ ළමයින්ගේ සාකල්‍ය සංවර්ධනයට සහාය වන සහ රැකියාවල නියුතු දෙමාපියන්ට/පවුල්වලට තම ළමයින් සුරක්ෂිතව සිටින්නේය යන හැඟීම ලබාදෙන, සමාජ සාධාරණ හා මිල දැරිය හැකි උසස් තත්ත්වයේ රැකවරණයක් සපයා දීම පිණිස ළමා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ඒවා නියාමනය කිරීම ඉලක්ක කරගනිමින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සිදුකරනු ලබයි. මෙමඟින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු කිහිපයකි. එනම් ,

1. රැකියාවල නියුතු දෙමාපියන්ගේ/පවුල්වල ළමයින් සඳහා මිල දැරිය හැකි ළමා දිවා සුරැකුම් පහසුකම්වලට සාධාරණ ප්‍රවේශය පුළුල් කිරීම.
2. ළමයින් තමන්ගේ උපරිම විභවය වෙත ළඟාවන බව සහතික කිරීම සඳහා උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් සේවා සැපයීම සඳහා පහසුකම් සැලසීම.
3. ආබාධ සහිත ළමයින් සඳහා උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම.
4. ළමා දිවා රැකවරණ පහසුකම් කළමනාකරණයේ ඵලදායිතාව ඉහළ නැංවීම.
5. කාර්යක්ෂම පාලනය සහ වගවීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ කාර්ය රාමුවක් හඳුන්වා දීම.

ප්‍රතිපත්තියේ කෙටුම්පත් කටයුතු අවසන් කර 2023 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට රේඛීය අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී.

## ජාතික දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (ක) වගන්තිය ප්‍රකාරව ළමා අපයෝජනයන්ට අදාළ ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ පවත්වාගෙන යාම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරයක් වේ. මේ අනුව මෙම දත්ත පද්ධතිය සකස් කිරීමට අවශ්‍ය මූලික කාර්යයන් සිදුකරමින් පවතී. අදියර 03කින් සිදුකිරීමට මූලික සැලසුම් සකස් කරන ලදී. ජාතික දත්ත පද්ධතිය සඳහා තොරතුරු තාක්ෂණ විද්වතුන්ගේ සහය ලබාගැනීම මෙන්ම බහුපාර්ශවීය ප්‍රවේශයන් මත ලැබෙන දත්ත ඇතුළත් කිරීම සිදුකළ යුතුව ඇත. මෙම දත්ත කළමණාකරන පද්ධතිය සකස් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම සිදුවිය. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි සඳහා දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. 2023 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි මෙහෙයවීම සඳහා ඇති දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදුකරන ලදී.

## 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය.


ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ මඟින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි භාරගැනීම ද පැය 24 පුරාම සිදුකරයි. මෙම දුරකථන සේවය සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ක්‍රියාත්මක වේ. 2023 වර්ෂයේදී 1929 ළමා උපකාරක දුරකථන සේවය වෙත පැමිණිලි 8469 ක් ලැබී ඇත. 1929 ළමා උපකාරක දුරකථන සේවය වෙත ඇමතුම් 118,993ක් ලැබී ඇත.

## ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහිපයකි. එම ක්‍රම පහත සඳහන් කර ඇත.

01. 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය හරහා ලැබෙන පැමිණිලි.
02. අධිකාරියට පැමිණ ඉදිරිපත් කරන පැමිණිලි.
03. ලිපි, ෆැක්ස්, ඊමේල් මඟින් ලැබෙන පැමිණිලි.
04. සයිබර් ආවේක්ෂණය මඟින් ලැබෙන තොරතුරු.
05. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් වෙත ලැබෙන පැමිණිලි.
06. ජනමාධ්‍ය හෝ සමාජ මාධ්‍ය මඟින් අනාවරණයවන ළමා අපයෝජන සිද්ධීන්.


මෙම ලැබෙන පැමිණිලි සියල්ලම සඳහා මූලික කටයුතු සිදුකරන අතර පැමිණිල්ලේ ස්වාභාවය අනුව වර්ග කිරීමක් සිදුකරයි. 2023 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබී ඇති සමස්ත පැමිණිලි ප්‍රමාණය 9436කි.





## වරදේ ස්වභාවය අනුව ළමා අපයෝජන පැමිණිලි වර්ගීකරණය

| අනු අංකය | වරදේ ස්වභාවය | පැමිණිලි ප්‍රමාණය |
|---|---|---|
| 01 | ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය ප්‍රකාශන - 286 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 06 |
| 02 | තම පාලනය යටතේ පරිශ්‍රයක සිදුවන ළමා අපයෝජනයක් දැනුම් නොදීම - 286 (ඇ) දණ්ඩ නීති සංග්‍රහය | 01 |
| 03 | ළමයින් සිගමනේ යෙදවීම - 288 දණ්ඩ නීති සංග්‍රහය | 323 |
| 04 | ලිංගික සංසර්ගය සඳහා කුට්ටනියෙකු වශයෙන් ක්‍රියාකිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම - 288 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 09 |
| 05 | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම - 288 (ආ) දණ්ඩ නීති සංග්‍රහය | 27 |
| 06 | ළමයින් කෲරත්වයට භාජනය කිරීම - 308 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 2238 |
| 07 | තුවාල සිදු කිරීම - 310 දණ්ඩ නීති සංග්‍රහය | 166 |
| 08 | බරපතල තුවාල සිදු කිරීම - 311 දණ්ඩ නීති සංග්‍රහය | 266 |
| 09 | ලිංගික අතවර කිරීම - 345. දණ්ඩ නීති සංග්‍රහය | 469 |
| 10 | ශ්‍රී ලංකාවෙන් අපහරණය කිරීම - 351 දණ්ඩ නීති සංග්‍රහය | 04 |
| 11 | නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය - 352. දණ්ඩ නීති සංග්‍රහය | 58 |
| 12 | පැහැරගෙනයාම - 353 දණ්ඩ නීති සංග්‍රහය | 217 |
| 13 | බරපතල තුවාල කිරීම සඳහා අපහරණය - 356 දණ්ඩ නීති සංග්‍රහය | 11 |
| 14 | ණය බැඳුම්කරය දාසභාවය හෝ අනිවාර්යෙන් වැඩ ගැනීම-358 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 04 |
| 15 | කුට්ටානියකු ලෙස ළමයින් යෙදවීම - 360 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 20 |
| 16 | ළමුන්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම- 360 (ආ) දණ්ඩ නීති සංග්‍රහය | 08 |
| 17 | ළමයින් වෙළඳාම් කිරීම - 360 (ඇ) දණ්ඩ නීති සංග්‍රහය | 32 |
| 18 | කුලවද්දා ගැනීමට අදාළ වැරදි -360(ඈ) දණ්ඩ නීති සංග්‍රහය | 03 |
| 19 | ලිංගික අපයෝජනය සඳහා ළමයෙකුට ඇවිටිලි කිරීම -360(ඉ) දණ්ඩ නීති සංග්‍රහය | 01 |
| 20 | ස්ත්‍රී දූෂණය - 363 දණ්ඩ නීති සංග්‍රහය | 50 |
| 21 | ව්‍යභිචාරය - 364 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 07 |
| 22 | අස්වාභාවික ලිංගික ක්‍රියා 365 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 01 |
| 23 | බරපතල ලිංගික අපයෝජනය - 365 (ආ) දණ්ඩ නීති සංග්‍රහය | 403 |
| 24 | අස්වාභාවික වැරදි - 365 දණ්ඩ නීති සංග්‍රහය | 0 |
| 25 | වැරදිවලට අදාළ පල කිරීම් 365 (ඇ) දණ්ඩ නීති සංග්‍රහය | 04 |


| | | |
|---|---|---|
| 26 | ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත | 2932 |
| 27 | ළමා ශ්‍රමිකත්වය - 1956 අංක 47 දරන පනත | 181 |
| 28 | ගෘහස්ථ හිංසනය - 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත | 46 |
| 29 | ළමා වැරදිකරුවන් | 310 |
| 30 | අනිවාර්ය අධ්‍යාපනය - 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනත | 1922 |
| 31 | ගබ්සාව | 03 |
| 32 | සියදිවි නසා ගැනීමට තැත් කිරීම | 25 |
| 33 | ළමා විවාහ | 39 |
| 34 | අන්තර්ජාල හිංසනය (නිරුවත් ඡායාරූප භාවිතා කරමින් තර්ජනය කිරීම) | 150 |
| 35 | උපදේශනය / මනෝ - සමාජ සහය අවශ්‍ය ළමයින් | 454 |
| 36 | ළමුන් සඳහා ප්‍රවේශය | 02 |
| 37 | මත්ද්‍රව්‍ය හේතුවෙන් සිදුවන අපචාර | 125 |
| 38 | මූල්‍යමය හා වෙනත් හේතූන් මත පාසල් යැවීමට නොහැකිවීම | 10 |
| 39 | වයස අවු 2 ට අඩු දරුවන් අතහැර මව විදේශගත වීම් | 03 |
| 40 | දරුවන්ගේ හැසිරීම සම්බන්ධ ගැටලු | 26 |
| 41 | දරුවන්ගේ ප්‍රචණ්ඩකාරී හැසිරීම සම්බන්ධ ගැටළු | 27 |
| 42 | මාර්ගගත අධ්‍යාපනය හා සම්බන්ධ ගැටළු | 01 |
| 43 | අධ්‍යාපන ආධාර සඳහා වන ඉල්ලීම් | 13 |
| 44 | යොවුන්වියේ ගැබ් ගැනීම් | 53 |
| 45 | උප්පැන්න සහතික නොමැතිවීම | 37 |
| 46 | පාසල් යාම ප්‍රතික්ෂේප කිරීම | 06 |
| 47 | පොලිස් පහර දීම් හා අත්අඩංගුවට ගැනීම් | 03 |
| 48 | වෙනත් | 691 |
| | **එකතුව** | **11387** |


2023 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබුණු සමස්ත පැමිණිලි, අවසන් කරන ලද පැමිණිලි සහ විමර්ශනය වෙමින් පවතින පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය
10000
8000
6000
4000
2000
0
9436
3536
5900
ලැබුණු පැමිණිලි ප්‍රමාණය
අවසන් කරන ලද පැමිණිලි ප්‍රමාණය
විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ප්‍රමාණය


2023 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබුණු ළමා අපයෝජන පැමිණිලි ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව විශ්ලේෂණය කිරීම
8000
6000
4000
2000
0
6065
6175
38
ස්ත්‍රී
පුරුෂ
අනන්‍යතාවය හඳුනාගත නොහැකි


2023 වර්ෂයේ පැමිණිලිවලට අදාළව වින්දිත ළමුන්ගේ වයස් කාණ්ඩ අනුව විශ්ලේෂණය කිරීම
6000
5000
4000
3000
2000
1000
0
2179
3239
5080
1525
5
260
0 - 05
06-10
11 - 15
16 - 18
19 වැඩි
වයස හඳුනාගත නොහැකි

❖ **ඉහත ප්‍රස්ථාරයෙන් ළමුන් 05 දෙනෙක් වයස අවුරුදු 19 ට වැඩි වශයෙන් දක්වා ඇත. එයට හේතු වන්නේ අවුරුදු 18ට අඩු වයස් කාලය තුළදී සිදු වූ ළමා අපයෝජනවලට අදාළව ලබාගත් පැමිණිලි හේතුවෙනි.**




## පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරකුම් පවුව)

ළමුන් සඳහා ළමා හිතකාමී පරිසරයක් පාසල තුළ නිර්මාණය කිරීම, අනිවාර්ය අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සහ ළමුන් ළමා අපයෝජනයෙන් වැළැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාසල්වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම මූලික අරමුණු වේ. මෙහිදී 2011/ 17 චක්‍රලේඛය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වෙමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. 2023 වර්ෂයේදී පාසල් ළමා ආරක්ෂක කමිටු ප්‍රවර්ධනය කිරීම සඳහා සක්‍රීය කමිටු සහිත පාසල් ඇගයීමක්ද සිදුකිරීමට සැලසුම් කරන ලදී. මේ සඳහා පාසල් 986 ක් ලියාපදිංචි වී ඇත. 2023 වර්ෂයේදී පාසල් ළමා ආරක්ෂක කමිටු 783 ක් පිහිටුවා ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 61,590 දෙනෙකි.

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර | ගාල්ල | මාතර | හම්බන්තොට | බදුල්ල | මොණරාගල | ත්‍රිකුණාමලය | මඩකලපුව | අම්පාර | පුත්තලම | කුරුණෑගල | මහනුවර | මාතලේ | නුවරඑළිය | අනුරාධපුර | පොළොන්නරුව | කෑගල්ල | රත්නපුරය | යාපනය | කිලිනොච්චිය | මුලතිව් | මන්නාරම | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාසල් ළමා ආරක්ෂක කමිටු සංඛ්‍යාව | 26 | 67 | 34 | 19 | 29 | 32 | 06 | 12 | 19 | 44 | 47 | 06 | 87 | 51 | 53 | 17 | 27 | 13 | 32 | 25 | 97 | 02 | 12 | 12 | 14 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2983 | 3655 | 2628 | 1493 | 2260 | 3286 | 248 | 661 | 1394 | 5630 | 2554 | 532 | 6450 | 3458 | 3264 | 587 | 2019 | 960 | 3609 | 1607 | 6892 | 922 | 2574 | 1022 | 902 |

## ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ "ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව, ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙමඟින් පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ දායකත්වය ලබා ගැනීම මෙන්ම පාසල් ප්‍රජාව ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමද මෙම වැඩසටහනෙන් සිදුකරයි. 2023 වර්ෂයේදී පාසල් 532 ක් ලියාපදිංචි වී ඇත. නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ පුහුණු වැඩසටහන් 02 ක් සිදුකරන ලදී. දැනුවත් කිරීමේ වැඩසටහන් 24 ක් පවත්වන ලදී. දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපති සමුළු 09 ක් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1500 දෙනෙකි.

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර | ගාල්ල | මාතර | හම්බන්තොට | බදුල්ල | මොනරාගල | ත්‍රිකුණාමලය | මඩකලපුව | අම්පාර | පුත්තලම | කුරුණෑගල | මහනුවර | මාතලේ | නුවරඑළිය | අනුරාධපුරය | පොළොන්නරුව | කෑගල්ල | රත්නපුරය | යාපනය | කිලිනොච්චිය | මුලතිව් | මන්නාරම | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි වූ පාසල් සංඛ්‍යාව | 33 | 31 | 21 | 21 | 14 | 10 | 24 | 07 | 44 | 18 | 63 | 17 | 39 | 55 | 17 | 13 | 34 | 04 | 23 | 26 | 07 | 02 | 03 | 04 | 02 |

## විශ්වවිද්‍යාල සිසුන් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ"විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන

විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම,කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. මෙම වැඩසටහන සඳහා 2023 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැනුවත් කිරීම මත රාජ්‍ය විශ්වවිද්‍යාල 17 ක් සඳහා කේන්ද්‍රීය සම්බන්ධීකාරක නිලධාරීන් පත් කරන ලදී. විශ්වවිද්‍යාල 17 න්ම විද්‍යාර්ථීන් 2265 දෙදෙනෙක් ලියාපදිංචි වී ඇත. දැනුවත් කිරීමේ වැඩසටහන් 07ක් පවත්වන ලදී. මෙම විශ්වවිද්‍යාල සිසුන් ස්වේච්ඡා පදනමින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පාසල් ශිෂ්‍ය තානාපති වැඩසටහන සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කරයි.

| විශ්වවිද්‍යාලය | කොළඹ | කැලණිය | ශ්‍රී ජයවර්ධනපුර | කොතලාවල | මොරටුව | ගම්පහ වික්‍රමාරච්චි | විවෘත විශ්වවිද්‍යාලය | පේරාදෙණිය | රුහුණු | යාපනය | වවුනියාව | වයඹ | නැගෙනහිර | නැගෙනහිර දකුණු | රජරට | ඌව වෙල්ලස්ස | සබරගමුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි වූ විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව | 102 | 197 | 130 | 23 | 9 | 22 | 8 | 107 | 42 | 346 | 34 | 251 | 231 | 604 | 92 | 43 | 24 |

## හදිසි/ආපදා අවස්ථාවලදී ළමා ආරක්ෂාව සහ ළමුන් සඳහා හදිසි සහන වැඩසටහන.

හදිසි/ආපදා තත්ත්වයන්ට මුහුණු දෙන ළමුන්ගේ ළමා ආරක්ෂාව හා යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා සුදුසු ළමා ආරක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම මෙහි මූලික අරමුණ වේ. එසේම ළමුන් සඳහා හදිසි සහන ලබාදීම මේ මඟින් සිදුකරයි. 2023 වර්ෂයේදී වැඩසටහන් සිදුකිරීම වෙනුවෙන් එක් දිස්ත්‍රික්කයකට රු. 750000ක් බැගින් දිස්ත්‍රික්ක 25 සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදෙන ලදී.

## වින්දිත, ආන්තික, අනාරක්ෂිත අවදානම්, ඇස නොගැටෙන ළමුන් සහ ළමා අපයෝජනයට ගොදුරු වූ ළමුන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැමිණිලි අංකයක් සහිතව වාර්තා වන පැමිණිලි තුළ හඳුනාගනු ලබන, අධ්‍යාපන ආධාර සඳහා නිර්දේශිත වින්දිත, ආන්තික, ආනාරක්ෂිත අවදානම් ළමුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම සඳහා සහය ලබාදීම මෙහි මූලික අරමුණ වේ. මේ යටතේ 2023 වර්ෂයේදී ළමුන් 685 දෙනෙකු සඳහා අධ්‍යාපනික ආධාර ලබාදෙන ලදී. මේ සඳහා රු. 3208000 මූල්‍ය ප්‍රතිපාදන ලබාදී ඇත.

## ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීමේ ජාතික වැඩසටහන

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 14 (ග) වගන්තියට අනුව ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියළු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇත. ඒ යටතේ දීප ව්‍යාප්තව ඇති ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝසාමාජීය නිලධාරීන් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් විසින් පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව 2023 වර්ෂයේදී ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ළමුන් සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 311ක් පමණ පවත්වා ඇත. 2023 වර්ෂයේදී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 306ක් අධීක්ෂණය සහ නියාමනය කරන ලදී.

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර | ගාල්ල | මාතර | හම්බන්තොට | බදුල්ල | මොනරාගල | ත්‍රිකුණාමලය | මඩකලපුව | අම්පාර | පුත්තලම | කුරුණෑගල | මහනුවර | මාතලේ | නුවරඑළිය | අනුරාධපුරය | පොළොන්නරුව | කෑගල්ල | රත්නපුරය | යාපනය | කිලිනොච්චිය | මුලතිව් | මන්නාරම | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අධීක්ෂණය සහ නියාමනය කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | 41 | 21 | 42 | 10 | 05 | 03 | 07 | 04 | 13 | 30 | 08 | 18 | 18 | 16 | 08 | 08 | 05 | 02 | 06 | 08 | 10 | 09 | 03 | 06 | 05 |

## ළමා අපයෝජන හා සම්බන්ධ සියලු අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ, 14 (ඌ) වගන්තිය ප්‍රකාරව ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම යන වගන්තිය වින්දිත ළමයාගේ උපරිම යහපත සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් බලාත්මක කරමින් ළමා අපයෝජන හා සම්බන්ධ සියලු අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම සිදුකරනු ලබයි. ජාතික ළමා ආරක්ෂක

අධිකාරිය විසින් නඩු නියාමන ක්‍රමවේදය ලෙස ප්‍රතිචාරාත්මක නියාමන ක්‍රමවේදය පසුගිය වසර තුළ භාවිතා කළ අතර 2023 වර්ෂයේ සිට ප්‍රතිචාරාත්මක මෙන්ම ප්‍රගාමී නඩු නියාමන ක්‍රමවේදයක් භාවිතා කරයි. ඒ අනුව මහාධිකරණයන්හි ක්‍රියාත්මකව පවතින ළමා අපයෝජන නඩු පිළිබඳව පොලිස් කොට්ඨාස මට්ටමින් තොරතුරු රැස්කිරීමේ කටයුතු ආරම්භ කළ අතර එලෙස රැස් කෙරෙන තොරතුරු දත්ත පද්ධතියකට ඇතුළත් කර අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිතය. එහි පළමු අදියර වශයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් දිවයින පුරා මහාධිකරණයන්හි විභාග වෙමින් පවතින ළමා අපයෝජන නඩු 648 ක් සම්බන්ධයෙන් ප්‍රගතිය නියාමන ක්‍රියාවලිය ආරම්භ කිරීමට මූලික පියවර ගෙන ඇත.

## ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන

ළමුන්ට සිදුවන අපයෝජන සම්බන්ධයෙන් මෙන්ම ඒවා වළක්වාගැනීම සම්බන්ධයෙන්ද විවිධ මැදිහත්වීම් සිදුකිරීමේදී වෛද්‍යවරුන් විසින් විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබයි. එම කාර්යභාරය වඩාත් ශක්තිමත් කිරීම උදෙසා  වෛද්‍යවරුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප දියුණු කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වැඩසටහන සිදුකර ඇත. 2023 වර්ෂයේදී ළමා ආරක්ෂාව පිළිබඳ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යාපනය ලබන වෛද්‍යවරුන් 30 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් පවත්වා ඇත.

## ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සවිඥානික හා සංවේදී ගුරු ප්‍රජාවක් හා කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම තුළින් ළමා හිතකාමී පාසලක අධ්‍යාපනය ලබන සුරක්ෂිත හා සතුටින් සිටින ළමා පරපුරක් බිහි කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. 2023 වර්ෂයේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 09ක වැඩසටහන් 09ක් සිදුකර අවසන් කරන ලදී. එමගින් දැනුවත් කරන ලද මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2790කි.

| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | පුලතිසි ජා.අ.වි.පී - පොළොන්නරුව | පස්දුන්රට ජා.අ.වි.පී. - කළුතර | ශ්‍රීපාද ජා.අ.වි. පී - නුවරඑළිය | නිල්වලා ජා.අ.වි.පී - මාතර | මඩකලපුව ජා.අ.වි.පී. - මඩකලපුව | යාපනය ජා.අ.වි.පී - යාපනය | සියනෑ ජා.අ.වි.පී - ගම්පහ | රුවන්පුර ජා.අ.වි.පී. -රත්නපුරය | වයඹ ජා.අ.වි.පී - කුරුණෑගල |
|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 244 | 360 | 271 | 338 | 227 | 230 | 440 | 305 | 375 |

## ළමා ආරක්ෂාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු විදුහල්වල හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් සංවේදී හෙද නිලධාරීන් පිරිසක් බිහි කිරීම තුළින් ළමුන් සම්බන්ධ සිදුකරන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු මැදිහත්කරණයන් ළමුන්ගේ උපරිම යහපත පිණිස සිදුකිරීම මෙහි මූලික අරමුණ වේ. මෙම වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු විදුහල් ආශ්‍රිතව සිදුකර ඇත. 2023 වර්ෂයේදී වැඩසටහන් 04ක් සිදුකර අවසන් කරන ලදී. එමඟින් දැනුවත් කරන ලද මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 729කි.

| හෙද පුහුණු විදුහල | අනුරාධපුරය | මහරගම | අම්පාර | ගාල්ල |
|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 85 | 45 | 273 | 326 |

## ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය ව්‍යාපාර, තොරතුරු, අධ්‍යාපන හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය, උත්සව සහ දින සැමරුම්, ප්‍රදර්ශන සහ ජංගම සේවා, NCPA නිල වෙබ් අඩවිය, මුහුණු පොත, You Tube සහ twitter පවත්වාගෙන යාම සම්බන්ධ සන්නිවේදන වැඩසටහන්

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සම්බන්ධයෙන් ප්‍රජා දැනුවත් කිරීමට අදාළ තොරතුරු සංවර්ධනය කිරීම සහ ඒවා භාවිතා කරමින් ප්‍රජා දැනුවත් කිරීම මෙහි මූලික අරමුණ වේ. මෙහිදී ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම, විවිධ ප්‍රකාශන, ළමා ආරක්ෂාවට අදාළ ප්‍රදර්ශන සහ ජංගම සේවා පැවැත්වීම, ළමා අපචාර, අපයෝජන සම්බන්ධව දෛනිකව පුවත්පත් වාර්තා නියාමනය කිරීම ජනමාධ්‍ය මඟින් සමාජය දැනුවත් කිරීම, දින සැමරුම් පැවැත්වීම, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය, මුහුණු පොත, you tube, twitter පවත්වාගෙන යාම සිදුකරයි. 2023 වර්ෂයේදී රූපවාහිනී , ගුවන්විදුලි සහ පුවත්පත් වැඩසටහන් 36ක් සඳහා සම්පත් දායකත්වය ලබාදී තිබේ. ප්‍රවෘත්ති නිවේදන 04ක් නිකුත් කරන ලදී. ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 01ක් පවත්වන ලදී. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පවත්වන ලදී. ප්‍රදර්ශන සහ ජංගම සේවා 5ක් පවත්වන ලදී. 144 දෙනෙකු සඳහා තොරතුරු ලබාදෙන ලදී.

මාධ්‍ය ව්‍යාපාරයක් සිදුකරන ලදී. දින සැමරුම් ලෙස 2023 වර්ෂයේ ලෝක ළමා දිනයට සමගාමීව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා අයිතීන් සහ ළමා ආරක්ෂාව තේමා කර ගනිමින් සංවිධානය කරන ලද සිතුවිලි සිත්තම් සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලියේ අවසන් විනිශ්චය කටයුතු සිදුකර

ජාතික මට්ටමේ ජයග්‍රාහකයන් 48ක් සහ දිස්ත්‍රික් ජයග්‍රාහකයන් 733ක් ලෙස සමස්ත ජයග්‍රාහකයන් 781ක් තෝරාගන්නා ලදී. ලැබුණු සමස්ත චිත්‍ර සංඛ්‍යාව 16277කි.

## **විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු කටයුතු පිළිබඳ නියාමනය, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් නියාමන කටයුතු සිදුකිරීම.**

ළමා අපයෝජනවලින් වින්දිත වූ ළමුන්ගේ රැකවරණය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ළමා අපයෝජන සම්බන්ධව විශේෂ විමර්ශනයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත ප්‍රකාරව සිදුකරනු ලබයි. 2023 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් අධිකරණයේ පෙනී සිටීම් 2158ක් සම්පූර්ණ කර ඇත, (මහාධිකරණ 1051, මහේස්ත්‍රාත් අධිකරණ 1108) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටීම් 37ක් සහ 1419 දෙනෙකුට නීති සහය ලබාදීම් සිදුකර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණ සහ දුරකතන මඟින් සයිබර් ආවේක්ෂණ පැමිණිලි 166ක් ලැබී ඇත.

| මාසය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශේෂ පොලිස් ඒකකය අධිකරණයේ පෙනී සිටීම් සංඛ්‍යාව | 278 | 252 | 250 | 110 | 224 | 212 | 189 | 142 | 194 | 239 | 212 | 131 |
| නීති අංශය අධිකරණයේ පෙනී සිටීම් සංඛ්‍යාව | 07 | 04 | 06 | 02 | 02 | 04 | 03 | - | 01 | 03 | 05 | 01 |
| නීති සහය ලබාදීම් සංඛ්‍යාව | 166 | 118 | 158 | 153 | 130 | 120 | 98 | 79 | 97 | 82 | 114 | 104 |
| සයිබර් ආවේක්ෂණ පැමිණිලි සංඛ්‍යාව | 14 | 13 | 13 | 13 | 19 | 16 | 14 | 14 | 13 | 16 | 08 | 13 |

## **ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝණය වූ ළමුන් සඳහා සහාය වීම.**

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත් වන ළමුන් ද්විතීක වින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මේ වන විටත් මෙම සේවාව

සිදුකරන අතර දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ (රාගම) ළමා පියස පරිශ්‍රයේ නව ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය මගින් ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සිදුකරයි. 2023 වර්ෂයේදී වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 252 අවසන් කරන ලදී. අධිකරණ නියෝග මත හා නීතිපති නියෝග මත වීඩියෝ සාක්ෂි පට 225ක් මුදා හැරීම සිදුකරන ලදී.

| මාසය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් සංඛ්‍යාව | 32 | 40 | 30 | 16 | 20 | 28 | 26 | 08 | 11 | 05 | 13 | 23 |
| වීඩියෝ සාක්ෂි පටිගත කිරීම්වල මුදා හරින ලද පිටපත් සංඛ්‍යාව | 12 | 07 | 12 | 06 | 12 | 12 | 10 | 25 | 32 | 50 | 34 | 13 |

### ජාතික ළමා කේන්ද්‍රීය මනෝසමාජීය උපකාර සේවාව.

වින්දිත ළමුන් ප්‍රමාණය අවම කිරීම හා ළමුන් අපයෝජනය වීමට ඇති අවදානම වැළැක්වීම, අධ්‍යාපනය සඳහා මනෝසමාජීය සහය ලබාදීම සහ කායිකව හා මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙමඟින් ළමා කේන්ද්‍රීය මනෝසමාජීය සහයක් ළමයින්ට ලබාදෙයි. මෙම සේවාව දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් විසින් සිදුකරයි. 2023 වර්ෂයේදී ළමුන් 783ක් සඳහා මනෝසමාජීය සහාය හා මැදිහත්වීම් ලබා දී ඇති අතර, පසු විපරම් 397ක් සිදුකර ඇත. එමෙන්ම ඊට අමතරව මනෝසමාජීය උපදේශන 157ක් හා සිද්ධි සම්මන්ත්‍රණ 26ක් පවත්වා ඇත. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ළමුන්ගේ පූර්ව මානසික සූදානම් කිරීම වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම් 09ක් සිදු කර ඇත.

| මාසය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මනෝසමාජීය සහාය හා මැදිහත්වීම් සංඛ්‍යාව | 150 | 58 | 140 | 81 | 39 | 95 | 30 | 56 | 69 | 82 | 82 | 96 |
| පසු විපරම් සංඛ්‍යාව | 39 | 72 | - | 42 | 50 | 27 | 78 | 05 | 12 | 04 | - | - |
| මනෝසමාජීය උපදේශන සංඛ්‍යාව | 25 | 22 | 27 | 23 | 08 | 16 | 09 | 07 | 05 | 07 | 07 | 08 |
| අධිකරණයේ පෙනී සිටීම් සංඛ්‍යාව | 01 | 02 | 01 | - | - | - | - | 02 | 02 | 01 | 01 | - |

## ළමා අපයෝජන ප්‍රතිසාධන විෂය මාලාව ( Child Abuse Recovery Curriculum)

වින්දිතභාවයට පත් වූ ළමුන් මනෝසමාජීයව ප්‍රතිසාධනය කර ඔවුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම හා ඔවුන් නැවත අපයෝජනය වීම වැළැක්වීම තුළින් සෞඛ්‍ය සම්පන්න පෞරුෂයන් ඔවුන් තුළ ගොඩගැනීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකාව තුළ විධිමත් ලෙස, වින්දිතයන් හට මනෝසමාජීය සහාය ලබාදීම වෙනුවෙන් චිකිත්සක ආදර්ශයක් ලෙස මෙම ප්‍රතිසාධන විෂය මාලාව භාවිතා කිරීම මෙහි මූලික අරමුණු වේ. 2023 වර්ෂයේදී ඉංග්‍රීසි මාධ්‍ය සහ සිංහල මාධ්‍ය ප්‍රතිසාධන විෂයමාලාව ප්‍රමිතිකරණය සඳහා වන විද්වත් කමිටුව වෙත යොමු කරන ලදී.

## නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන

නවාතැන් පහසුකම් සපයන ආයතනවලදී ළමයින්ට සිදුවිය හැකි සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කිරීම සඳහා එම ආයතන ප්‍රධානීන් මූලික දැනුවත් කිරීමකින් පසුව විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මෙහි මූලික අරමුණු වේ. 2023 වර්ෂයේදී දිස්ත්‍රික්ක 15ක වැඩසටහන් 15ක් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 570 දෙනෙකි.

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර | මාතර | හම්බන්තොට | බදුල්ල | මොණරාගල | ත්‍රිකුණාමලය | අම්පාර | කුරුණෑගල | මහනුවර | මාතලේ | කෑගල්ල | රත්නපුරය | මන්නාරම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 40 | 08 | 35 | 45 | 34 | 45 | 32 | 35 | 35 | 80 | 10 | 45 | 45 | 41 | 40 |

## විගමනික සේවකයින්ගේ ළමුන් සියලු ආකාරයේ සාහසිකත්වයන්ගෙන් ආරක්ෂාවීම තහවුරු කිරීම සඳහා ''පවුල් හමු'' තාක්ෂණික මෙවලම හඳුන්වාදීමේ ජාතික වැඩසටහන

විගමනික සේවකයින්ගේ පවුල් සමඟ කටයුතු කිරීම සම්බන්ධව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සඳහා ''පවුල් හමු'' තාක්ෂණික මෙවලම පිළිබඳ වැඩමුළු පැවැත්වීම හා මෙම තාක්ෂණික මෙවලම් දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් භාවිතා කිරීම මෙහි මූලික අරමුණ වේ. 2023 වර්ෂයේදී වැඩමුළු 01ක් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 43 දෙනෙකි.

## වෙරළබඩ කලාපය ආශ්‍රිත ගම්මානවල ජීවත්වන ළමුන්ගේ යහපැවැත්ම නඟා සිටුවීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ වැඩසටහන

වෙරළබඩ කලාපය ආශ්‍රිතව ජීවත්වන පවුල් ළමා සුරක්ෂිත පවුල් බවට පත් කරමින් එහි ජීවත්වන ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින්, සතුටින් ජීවත්වන පිරිසක් බවට පත් කිරීම හා ළමා ආරක්ෂක ක්‍රියාවන්හී සක්‍රීයව නිරතවන සංවේදී නිලධාරීන් පිරිසක් වෙරළබඩ කලාපය ආශ්‍රිතව නිර්මාණය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. 2023 වර්ෂයේදී වැඩසටහන් 12 ක් පවත්වන ලදී. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 402 දෙනෙකි.

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර | ගාල්ල | මාතර | හම්බන්තොට | නුවරඑළිය | අම්පාර | පුත්තලම | යාපනය | මුලතිව් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 02 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 43 | 28 | 76 | 33 | 30 | 35 | 30 | 32 | 35 | 30 | 30 |

## වැව්ලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වෙසෙන ළමුන්ගේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ ප්‍රජා වැඩසටහන

වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව ජීවත්වන පවුල් ළමා සුරක්ෂිත පවුල් බවට පත්කරමින්, එහි ජීවත්වන ළමුන් සම්බන්ධ අවදානම් සහ අභියෝග කලින් හඳුනාගෙන සියලු ආකාරයේ ළමා අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින් සතුටින් ජීවත්වන පිරිසක් බවට පත් කිරීම හා ළමා ආරක්ෂක ක්‍රියාවන්හි සක්‍රීයව නිරතවන සංවේදී නිලධාරීන් පිරිසක් වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිත ප්‍රජාව සඳහා සේවා දායකත්වය ලබාදීම මෙහි මූලික අරමුණ වේ. 2023 වර්ෂයේදී වැඩසටහන් 16ක් පවත්වන ලදී. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 724 දෙනෙකි.

| දිස්ත්‍රික්කය | කොළඹ | කළුතර | ගාල්ල | මොණරාගල | කුරුණෑගල | මහනුවර | මාතලේ | නුවරඑළිය | කෑගල්ල | රත්නපුර | බදුල්ල | මාතර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 | 02 | 01 | 01 | 01 | 01 | 03 | 02 | 01 | 01 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 39 | 70 | 30 | 112 | 47 | 53 | 36 | 35 | 126 | 75 | 56 | 45 |

### ආගමික පූජ්‍ය, පූජක ප්‍රසාදීන් දැනුවත් කිරීමේ නියමු වැඩසටහන

මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ ආගමික ස්ථානවල දී ළමයින්ට සිදුවිය හැකි සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමයි. 2023 වර්ෂයේදී වැඩසටහන් 15ක් පවත්වන ලදී. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 582 දෙනෙකි.

| දිස්ත්‍රික්කය | නුවරඑළිය | කෑගල්ල | පුත්තලම | හම්බන්තොට | බදුල්ල | රත්නපුරය | මොණරාගල | මුලතිව් | කළුතර | මාතර | ගාල්ල | කොළඹ | මාතලේ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 | 01 | 01 | 01 | 02 | 01 | 01 | 02 | 01 | 01 | 01 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 45 | 45 | 27 | 26 | 45 | 49 | 78 | 45 | 45 | 65 | 40 | 42 | 30 |

### ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීම මඟින් සෑම ළමයෙකුම සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මෙහි මූලික අරමුණ වේ. 2023 වර්ෂයේදී වැඩසටහන් 1192ක් පවත්වන ලදී. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 74720 දෙනෙකි.

| දිස්ත්‍රික්කය | කොළඹ | ගම්පහ | කළුතර | ගාල්ල | මාතර | හම්බන්තොට | බදුල්ල | මොණරාගල | ත්‍රිකුණාමලය | මඩකලපුව | අම්පාර | පුත්තලම | කුරුණෑගල | මහනුවර | මාතලේ | නුවරඑළිය | අනුරාධපුරය | පොළොන්නරුව | කෑගල්ල | රත්නපුරය | යාපනය | කිලිනොච්චිය | මුලතිව් | මන්නාරම | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 45 | 61 | 05 | 34 | 134 | 30 | 03 | 46 | 04 | 20 | 105 | 01 | 100 | 41 | 85 | 15 | 48 | 11 | 94 | 112 | 179 | 01 | 08 | 03 | 07 |

### විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට, 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය ඔස්සේ හා වෙනත් ක්‍රම මඟින් ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය කටයුතු කරනු ලබයි.

**2023 වර්ෂයේ දී විශේෂ පොලිස් විමර්ශන ඒකකය මගින් විමර්ෂණය කරන ලද පැමිණිලි සම්බන්ධ වාර්තාව**

| අනු අංකය | වරද | වාර්තා වූ ගණන | විමර්ශනය වන ගණන | විමර්ශනය අවසන් ගණන | අසත්‍ය | අධිකරණයට යොමු කළ ගණන | අධිකරණයේ කැඳවන ගණන | බැහැර පොලිස් ස්ථානවලට විමර්ශන සඳහා යොමු කළ |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | සුළු අපරාධ | 05 | - | 05 | - | 05 | 04 | - |
| 02 | විවිධ පැමිණිලි | - | - | - | - | - | - | - |
| 03 | බල අපරාධ | 12 | - | 12 | - | 12 | 08 | 01 |
| මුළු සංඛ්‍යාව | | **17** | **-** | **17** | **-** | **17** | **12** | **01** |

## ඡායාරූප එකතුව

### 01 . වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව සිදුකළ වැඩසටහන්

කොත්මලේ




### 02. වෙරළබඩ කලාපය ආශ්‍රිතව සිදුකළ වැඩසටහන්




### 03. හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

අනුරාධපුරය




## 04. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්

මාතර - නිල්වලා





## 05. පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ වැඩසටහන්





## 06.ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ "ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන





## 07.විශ්වවිද්‍යාල සිසුන් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ "විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන





## 08.“සිතුවිලි සිත්තම්” සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලිය





**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**2023/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1. පොදු තොරතුරු**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇති අතර එහි ප්‍රධාන කාර්යාලය අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර යන ලිපිනයේ පිහිටා ඇත.

**2. ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් කර ඇත. අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස, මෙහි සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සියලුම වර්ෂයන් සඳහා අඛණ්ඩව අදාළ කරගෙන ඇත. මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය (ශේෂ පත්‍රය), මූල්‍ය කාර්යසාධනය (ආදායම් ප්‍රකාශය), හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ආදිය ඇතුළත් වේ.

**3. සකස් කිරීමේ පදනම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කෙරේ. 1972 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 (අ) (xxvi) වගන්තිය සහ 42 (ඊ) වගන්තිය මඟින් සලසා ඇති විධිවිධාන යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආදායම් බද්දට යටත් නොවේ. මූල්‍ය ප්‍රකාශ පිරිවැය පදනම යටතේ සකස් කෙරේ.

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ගිණුම් පිළියෙල කිරීමේදී පහත සඳහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.**

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

මෙම ප්‍රමිතිය මඟින් ආයතනයේ පූර්ව කාල පරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන, අනෙකුත් ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීම තහවුරු කිරීම සඳහා පොදු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළයුතු ආකාරය නිශ්චිතව දක්වයි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ප්‍රමිතිය මඟින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, ඒවායේ ව්‍යූහය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සැපයීම සහ ගිණුම්කරණ උපචිත පදනම යටතේ සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය සඳහා වන නියමයන් සම්බන්ධයෙන් සමස්ථ සලකා බැලීම් ඉදිරිපත් කරයි. පිළිගැනීම, මිනුම්ක්‍රම සහ විශේෂිත ගනුදෙනු හෙළිදරව් සහ අනෙකුත් කාරණා මේ යටතට අයත් වේ.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය මඟින් මුදල් ප්‍රවාහ මූලාශ්‍ර, වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ මුදල් වියදම් කර ඇති අයිතමයන් සහ වාර්තා කරන දිනට මුදල් ශේෂය හඳුනා ගනියි. ආයතනයක මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට වගකීම සහ තීරණ ගැනීමේ අරමුණු සඳහා ප්‍රයෝජනවත් වේ. මුදල් ප්‍රවාහ තොරතුරු මඟින් රාජ්‍ය අංශයේ ආයතනයක් තම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අරමුදල් රැස් කරන්නේ කෙසේද යන්න සහ එකී මුදල් භාවිතා කරන්නේ කවරාකාරයටද යන්න පිළිබඳ නිශ්චය කිරීම සඳහා පරිශීලකයන්ට අවස්ථාව සලසයි. ආයතනයේ ක්‍රියාකාරකම්වල තිරසාරභාවය ආදී සම්පත් වෙන් කිරීම් පිළිබඳ තීරණ ගැනීමේදී සහ තොරතුරු ඇගයීමේදී පරිශීලකයන්ට මුදල් ප්‍රවාහවල කාලය සහ නිශ්චිත බව පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ. මෙම ප්‍රමිතියේ අරමුණ වන්නේ මෙහෙයවීම, ආයෝජනය සහ මූල්‍යකරණ ක්‍රියාකාරකම් සිදුකරන කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහයන් වර්ගීකරණය කරනු ලබන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් මඟින් ආයතනයේ මුදල් සහ මුදල් සමාන දෑ වල ඓතිහාසික වෙනස්කම් පිළිබඳව අවශ්‍ය තොරුතුරු සැපයීමයි.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ**

මෙම ප්‍රමිතිය මඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ වෙනස් කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් හෙළිදරව් කිරීම සහ මූල්‍ය ගනුදෙනු මෙහෙයවීම නිශ්චය කිරීමේදී භාවිතා කළ යුතු රීති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම දෝෂ නිවැරදි කිරීම ආදිය සඳහා නිර්ණායක නියම කරයි. තවද, මෙම ප්‍රමිතිය මඟින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල අදාලත්වය සහ විශ්වසනීය බව ඉහළ නැංවීමට අපේක්ෂා කරන අතර, එම මූල්‍ය ප්‍රකාශන කාලානුරූපීව අනෙකුත් ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමට ද උපකාරී වේ.

1. ක්ෂය කිරීම

ඉඩම්, ක්ෂය කිරීම්වලට යටත් නොවේ. අනෙකුත් වත්කම් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් පරිදි ක්ෂය කරනු ලබයි. යම් දේපළ, පිරියත සහ උපකරණ මිලදීගත් අවස්ථාවේ සිට එය භාවිතයෙන් ඉවත් කරන තෙක් ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් රථ | 10% |
| කාර්යාල ලී බඩු | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| පරිගණක සහ උපාංග | 25% |
| ක්‍රීඩා භාණ්ඩ | 15% |
| සංගීත භාණ්ඩ | 25% |
| කෘෂි උපකරණ | 25% |

නිශ්චිත පරිත්‍යාගශීලි නියෝජිතායතන සමඟ අත්සන් තබා ඇති ගිවිසුමට අනුව ව්‍යාපෘති අරමුදල් භාවිතා කර මිලදීගත් අයිතමයන්, පිරියත සහ උපකරණ කිසිවක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගිවිසුම්වලට ඇතුළත් නොවේ. ව්‍යාපෘති අරමුදල් යටතේ මිලදීගත් දේපළ, පිරියත සහ උපකරණ අදාළ පරිත්‍යාගශීලි නියෝජිතායතනය වෙත අයත්ය. එම උපකරණවල හිමිකාරිත්වය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරන තෙක් ව්‍යාපෘති සඳහා වෙනම වත්කම් ලැයිස්තු පවත්වාගෙන යනු ලැබේ.

2. ක්‍රමක්ෂය

බදු කාල පරිච්ඡේදය පදනම් කරගනිමින් ඉඩම් ක්‍රමක්ෂය කරනු ලැබේ. අනෙකුත් වත්කම් පහත සඳහන් ක්ෂය අනුපාත යටතේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

<u>ඉඩම් පිළිබඳ තොරතුරු බදු කාල පරිච්ඡේදය (වර්ෂ)</u>

| | |
|---|---|
| ඉඩම් (2000) | 50 |
| ඉඩම් (2016) | 30 |

<u>අනෙකුත් වත්කම් ක්‍රමක්ෂය අනුපාතය</u>

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් රථ | 10% |
| කාර්යාල ගෘහ භාණ්ඩ | 15% |

| | |
|---|---|
| කාර්යාල උපකරණ | 15% |
| පරිගණක සහ උපාංග | 25% |
| ක්‍රීඩා භාණ්ඩ | 15% |
| සංගීත භාණ්ඩ | 25% |
| කෘෂි උපකරණ | 25% |

**ගිණුම් සඳහා සටහන්**

**සටහන 01:- ක්‍රමක්ෂය**

වන්දි ගෙවීමට අපේක්ෂිත අදාළ පිරිවැය ආයතනය විසින් වියදම් වශයෙන් හඳුනා ගැනෙන අතර ප්‍රදාන, කාල පරිච්ඡේදය පුරා ලාභ හෝ අලාභ පදනම මත හඳුනා ගැනේ.

**සටහන 02- අවිනිශ්චිත වගකීම්**

සේවා තහනමකට යටත් කළ සේවකයෙකු සම්බන්ධයෙන් විභාග වන නඩුවට අදාළ අවිනිශ්චිත වගකීම් අධිකාරිය සතුය.

**සටහන 03- විලම්භිත ආදායම්**

2023 ස්ථාවර වත්කම්වලට සාපේක්ෂව වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය වටිනාකම, සටහන “1 ආ" හි දක්වා ඇති විවිධ ආදායම් ගිණුමට ඇතුළත් කර ඇත.

**සටහන 04- උපචිත වියදම්**

2024.01.31 දිනට වාර්තාගත වූ උපචිත වියදම් පමණක් මුළු උපචිත වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් වේ.

**සටහන 05- පාරිතෝෂික ප්‍රතිපාදන**

වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් සඳහා 2023 වසර සඳහා පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කර ඇත.

**සටහන 06- අවසන් තොග**

ලිපිද්‍රව්‍ය අවසන් තොග "සාමාන්‍ය පිරිවැය පදනම" මත අගය කර ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| විස්තරය | සටහන් | රු. 2023 | රු. 2022 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| පුනරාවර්තන ප්‍රදාන - මහාභාණ්ඩාගාරය | | 279,390,000.00 | 274,380,000.00 |
| - අනෙකුත් ආයතන | 1(අ) | 3,957,163.00 | 436,612.00 |
| අනෙකුත් ආදායම් | 1(ආ) | 15,960,197.77 | 18,399,836.87 |
| ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 34,447,243.97 | 31,027,255.90 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන | 1(ඇ) | 437,429.14 | 202,943.76 |
| **මුළු ආදායම** | | **334,192,033.88** | **324,446,648.53** |
| **වියදම්** | | | |
| පරිපාලන වියදම් | 2 | 260,898,047.14 | 264,162,936.01 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3 | 79,837,639.02 | 70,102,684.18 |
| ව්‍යාපෘති වියදම් | 4 | 3,957,163.00 | 436,612.00 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම් | 5 | 839,884.94 | - |
| මූල්‍ය වියදම් | 6 | 530.73 | - |
| **මුළු වියදම්** | | **345,533,264.83** | **334,702,232.19** |
| **කාලච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)** | 7 | **(11,341,230.95)** | **(10,255,583.66)** |

| **අතිරික්තය / ඌනතාවය - සාරාංශය** | | |
|---|---|---|
| කාලච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) භාණ්ඩාගාර අරමුදල් | | (10,938,775.15) |
| කාලච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) ජාතික ළමා ආරක්ෂක අරමුදල | | (402,455.80) |
| **කාලච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)** | | **(11,341,230.95)** |

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විස්තරය | සටහන් | Rs. 2023 | Rs. 2022 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 181,519,432.38 | 190,748,784.93 |
| කල්බදු ඉඩම් | 8.1 | 17,812,701.01 | 18,591,742.11 |
| දිගුකාලීන ලැබිය යුතු වත්කම් | 9 | 2,425,739.83 | 1,969,607.45 |
| | | **201,757,873.22** | **211,310,134.49** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය | | 1,140,746.82 | 961,545.39 |
| ආයෝජන සහ ඉතුරුම් | 10 | 9,347,501.25 | 531,497.24 |
| ලැබිය යුතු ගිණුම් | 11 | 2,981,613.58 | 10,426,783.25 |
| ඉදිරියට කළ ගෙවීම් | 12 | 392,792.85 | 640,803.89 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 13 | 3,684,796.85 | 6,190,966.96 |
| | | **17,547,451.35** | **18,751,596.73** |
| **මුළු වත්කම්** | | **219,305,324.57** | **230,061,731.22** |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 72,932,907.50 | 66,134,780.00 |
| ව්‍යාපෘති ගිණුම්වල අතිරික්තය | 14-A | 877,075.27 | 1,456,238.27 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 14-B | 1,693,044.44 | 2,095,500.24 |
| | | **75,503,027.21** | **69,686,518.51** |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 15 | 8,729,111.57 | 2,865,411.81 |
| කෙටිකාලීන වෙන් කිරීම් | 16 | 950,893.50 | 1,266,153.50 |
| | | **9,680,005.07** | **4,131,565.31** |
| **මුළු වගකීම්** | | **85,183,032.28** | **73,818,083.82** |
| **ශුද්ධ වත්කම්** | | **134,122,292.29** | **156,243,647.40** |
| **මූල්‍යනය වන්නේ** | | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | 17 | 38,516,248.32 | 41,957,104.80 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 160,366,469.85 | 166,669,981.25 |
| රඳවාගත් ඉපැයුම් | | (64,760,425.88) | (52,383,438.65) |
| | | **134,122,292.29** | **156,243,647.40** |

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| තොරතුරු | සටහන් | Rs.<br>2023 | Rs.<br>2022 |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ අතිරික්තය / (ඌනතාවය) | | (11,341,230.95) | (10,255,583.66) |
| <u>පෙර වසරේ ගැලපුම්</u> | | | |
| රඳවාගත් ඉපැයීම් | | (1,438,212.08) | (2,528,957.51) |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | | - | (11,077.53) |
| මුදල් නොවන සංචලනයන් | | | |
| ක්ෂයවීම් | 8 | 13,336,809.06 | 12,166,941.82 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය | 8.1 | 779,041.10 | 779,041.10 |
| පරිත්‍යාගවලින් ලැබූ ස්ථාවර වත්කම් | | (3,409,700.48) | (6,199,100.00) |
| නැවත තක්සේරු කළ ස්ථාවර වත්කම් | | - | (83,832,231.70) |
| වත්කම් ඉවත් කිරීමේ ක්ෂය | | (355,015.00) | (1,675,054.64) |
| ප්‍රාග්ධන ප්‍රදාන පරිත්‍යාග | | - | 2,663,600.00 |
| ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන ප්‍රදාන | | - | (12,945,982.92) |
| ක්‍රමක්ෂය වූ ව්‍යාපෘති අරමුදල් | | (3,957,163.00) | (436,612.00) |
| ක්‍රමක්ෂය වූ ප්‍රත්‍යාගණන සංචිත | | (6,303,511.40) | 83,829,147.45 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | | |
| ගෙවිය යුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්) | | 5,863,699.76 | (281,337.94) |
| කෙටි කාලීන වෙන් කිරීම් වැඩිවීම් / (අඩුවීම්) | | 26,100.00 | (348,000.00) |
| තොග වැඩිවීම් / (අඩුවීම්) | | (179,201.43) | (114,426.62) |
| ලැබිය යුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්) | | (55,999.54) | 1,299,352.99 |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | | 248,011.04 | (97,740.94) |
| පාරිතෝෂික දායකය | | 8,170,077.50 | 8,431,387.50 |
| පාරිතෝෂික ගෙවීම් | | (1,713,310.00) | (1,551,867.50) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(329,605.42)** | **(11,108,502.10)** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | | (697,756.03) | (1,581,276.30) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් | | 355,015.00 | 1,689,216.41 |
| දිගුකාලීන ලැබියයුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්) | | (456,132.38) | (1,969,607.45) |
| ආයෝජන ප්‍රතිලාභ | | (550,616.06) | 1,272,813.32 |
| ස්ථාවර තැන්පතු වැඩිවීම් | | (764,218.74) | (2,677,587.60) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | **(2,113,708.21)** | **(3,266,441.62)** |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | |
| ව්‍යාපෘති අරමුදල් සඳහා ප්‍රතිපාදන | 14 | 3,378,000.00 | 24,000.00 |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | 17 | (3,440,856.48) | 4,928,244.10 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | **(62,856.48)** | **4,952,244.10** |
| මුදල් සහ මුදල්වලට සමාන දෑවල ශුද්ධ අඩුවීම් | | **(2,506,170.11)** | **(9,422,699.62)** |
| කාලපරිච්ඡේදයේ ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ | | **6,190,966.96** | **15,613,666.58** |
| කාලපරිච්ඡේදයේ අවසාන මුදල් හා මුදල්වලට සමාන දෑ | **13** | **3,684,796.85** | **6,190,966.96** |

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

රු.

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|
| **2022 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය** | **43,569,799.47** | **34,038,634.65** | **(39,403,453.72)** | **38,204,980.40** |
| **විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | (10,458,527.42) | (10,458,527.42) |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (1,612,694.67) | 132,631,346.60 | (2,521,457.51) | 128,497,194.42 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **41,957,104.80** | **166,669,981.25** | **(52,383,438.65)** | **156,243,647.40** |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් | 3,673,726.25 | - | (1,438,212,.08) | 2,235,514.17 |
| වර්ෂය සඳහා ලාභය හෝ අලාභය | - | - | (10,938,775.15) | (10,938,775.15) |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (7,114,582.74) | (6,303,511.40) | - | (13,418,094.14) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,516,248.31** | **160,366,469.85** | **(64,760,425.88)** | **134,122,292.28** |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

රු. රු.

| සටහන් 1 අ | 2023 | 2022 |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන - අනෙකුත් පරිත්‍යාගශීලි නියෝජිතයන් | | |
| යුනිසෙෆ් ක්‍රියාකාරී සැලැස්ම | 3,141,750.00 | - |
| මහජන බැංකුව | 410,413.00 | 36,612.00 |
| සුනාමි අරමුදලේ ආදායම් | 405,000.00 | 400,000.00 |
| **එකතුව** | **3,957,163.00** | **436,612.00** |

රු. රු.

| සටහන් 1 ආ | 2023 | 2022 |
|---|---|---|
| **අනෙකුත් ආදායම්** | | |
| අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කිරීම | - | 3,607,000.00 |
| පොලී ආදායම් | 964,858.68 | 471,182.88 |
| ආපදා ණය පොලී | 115,405.87 | 15,911.47 |
| විවිධ ආදායම් | 747,183.06 | 806,542.84 |
| විලම්භිත අදායම් | 14,115,850.16 | 12,945,982.92 |
| පරිත්‍යාග | - | 290,040.75 |
| අබලි භාණ්ඩ විකුණුම් ගිණුම | 16,900.00 | 263,176.01 |
| **එකතුව** | **15,960,197.77** | **18,399,836.87** |

රු.

| සටහන් 1 ආ (1) | 2023 | 2022 |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳ විස්තර | | |
| සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම | - | 2,782,000.00 |
| ගාස්තු රහිත පැය 24 ළමා උපකාරක දුරකථන සේවය - ක්‍රියාකාරී සැලැස්ම | - | 825,000.00 |
| එකතුව | - | **3,607,000.00** |

| සටහන් 1 ඇ | 2023 | 2022 |
|---|---|---|
| ලැබීම් - ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අරමුදල | | |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරී අරමුදල | 437,429.14 | 202,943.76 |
| එකතුව | **437,429.14** | **202,943.76** |

**සටහන 2 - පරිපාලන වියදම්**

| සටහන 2.1 | 2023 රු. | 2022 රු. |
|---|---|---|
| සේවක පඩිනඩි | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා වේතන | 150,563,526.76 | 150,370,123.67 |
| සේවක අර්ථ සාධක අරමුදල | 21,747,410.36 | 21,946,994.27 |
| සේවක භාර කාර අරමුදල | 5,454,042.68 | 5,505,663.97 |
| මාසික දීමනා | 23,766,110.29 | 24,313,244.51 |
| විශේෂ දීමනා (Cool Allowance ) | 70,661.65 | 34,507.60 |
| අතිකාල | 1,680,007.61 | 2,122,907.24 |
| නිවාඩු දින ගෙවීම් | 79,045.50 | 92,519.25 |
| ජීවන වියදම් දීමනා | 30,614,242.17 | 31,660,927.39 |
| පාරිතෝෂික දායක මුදල් | 8,170,077.50 | 8,431,387.50 |
| වැඩ බැලීමේ ගෙවීම් | 5,148,949.40 | 4,911,951.87 |
| ආධුනික පුහුණුවන්නන් සඳහා දීමනා ගෙවීම් | 1,747,000.00 | 1,357,750.00 |
| ඉන්ධන සහ වාහන දීමනා | 8,184,973.22 | 9,354,746.29 |
| එකතුව | **257,226,047.14** | **260,102,723.56** |

| සටහන 2.2 | 2023 රු. | 2022 රු. |
|---|---|---|
| ගමන් වියදම් | | |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා - දිස්ත්‍රික් නිලධාරීන් | 3,358,464.67 | 3,443,212.27 |
| කාර්යාල කාර්ය මණ්ඩලය | 54,950.00 | 69,175.00 |
| වාහන කුලී ගාස්තු | 258,585.33 | 364,897.18 |
| විදේශ ගමන් වියදම් | - | 182,928.00 |
| එකතුව | **3,672,000.00** | **4,060,212.45** |

සටහන 3 - අනෙකුත් මෙහෙයුම් වියදම්

| සටහන 3.1 | 2023 රු. | 2022 රු. |
| --- | --- | --- |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 3,206,429.19 | 2,736,262.52 |
| දිස්ත්‍රික් නිලධාරීන් සඳහා ලිපිද්‍රව්‍ය | 1,059,362.18 | 1,312,454.16 |
| පුවත්පත් | 332,160.00 | 218,710.00 |
| ඉන්ධන | 1,242,700.00 | 1,806,634.91 |
| **එකතුව** | **5,840,651.37** | **6,074,061.59** |

| සටහන 3.2 | 2023 රු. | 2022 රු. |
| --- | --- | --- |
| නඩත්තු වියදම් | | |
| මෝටර්රථ | 2,438,423.72 | 1,394,411.68 |
| පරිගණක සහ උපකරණ | 996,905.41 | 1,402,143.27 |
| ගොඩනැගිල්ල සහ කාර්යාලය | 535,957.00 | 549,073.00 |
| **එකතුව** | **3,971,286.13** | **3,345,627.95** |

| සටහන 3.3 | 2023 රු. | 2022 රු. |
| --- | --- | --- |
| කොන්ත්‍රාත්ගත සේවා | | |
| දුරකථන ගාස්තු | 5,187,762.99 | 5,204,289.21 |
| මුද්දර සහ තැපැල් ගාස්තු | 725,200.00 | 401,940.00 |
| විදුලිය | 5,386,653.56 | 2,682,785.18 |
| ජලගාස්තු | 380,852.66 | 252,955.92 |
| රක්ෂණය | 554,520.41 | 707,939.48 |
| ආරක්ෂක සේවා | 3,996,776.58 | 3,444,924.83 |
| සනීපාරක්ෂක සේවා | 1,989,086.25 | 1,641,179.00 |
| මුද්‍රණ ගාස්තු | 11,315.00 | 275,988.00 |
| පරිවර්තන ගාස්තු | - | 1,112.50 |
| වරිපනම් සහ බදු | 81,816.38 | 105,454.38 |
| විගණන ගාස්තු | 476,100.00 | 450,000.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | 732,236.10 | 639,348.00 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 189,344.00 | 123,800.00 |
| විගණන හා කළමනාකරණ කමිටුව | 131,595.00 | 105,128.00 |
| වෙබ් අඩවි නඩත්තුව | 315,381.60 | 418,378.60 |
| සේවා ගිවිසුම - පරිගණක සහ අනෙකුත් | 788,007.87 | 501,354.23 |
| 1929 ආහාර දීමනාව | 299,200.00 | 215,400.00 |
| **එකතුව** | **21,245,848.40** | **17,171,977.33** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 3.4** | **2023** | **2022** |
| **ක්ෂය/ක්‍රමක්ෂය** | | |
| බදු දේපළ | 779,041.10 | 779,041.10 |
| ගොඩනැගිලි | 2,727,517.50 | 1,050,872.85 |
| මෝටර්රථ | 4,844,500.00 | 4,844,500.00 |
| ලී බඩු | 1,007,277.02 | 1,549,539.13 |
| උපකරණ | 3,060,358.66 | 3,186,178.87 |
| SAIEVAC ව්‍යාපෘතිය | | |
| - උපකරණ | 750.00 | 2,750.00 |
| UNDP ව්‍යාපෘතිය | | |
| - උපකරණ | 267,399.79 | 267,399.79 |
| UNICEF ව්‍යාපෘතිය | | |
| - මෝටර්රථ | 660,300.00 | 660,300.00 |
| - උපකරණ | 748,609.09 | 374,004.18 |
| GIZ -මෝටර් රථ | - | 211,300.00 |
| **SAVE THE CHILDREN -** උපකරණ | 20,097.00 | 20,097.00 |
| එකතුව | **14,115,850.16** | **12,945,982.92** |

| **සටහන 3.5** | **2023** | **2022** |
|---|---|---|
| **අනෙකුත් මෙහෙයුම් වියදම්** | | |
| විවිධ වියදම් | 109,734.00 | 245,187.10 |
| සභාපති - සංග්‍රහ වියදම් | 421,336.75 | 535,181.89 |
| **එකතුව** | **531,070.75** | **780,368.99** |

| | රු. | රු. |
|---|---|---|
| සටහන **3.6** | 2023 | 2022 |
| **NDAP- වියදම් ක්‍රියාත්මක කිරීම** | | |
| ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ දත්ත පද්ධතිය නඩත්තු කිරීම | 3,882,612.07 | 1,626,153.13 |
| ළමා ආරක්ෂාව සුවිශේෂ වූ විධිවිධාන සැලැස්ම | 12,165,058.08 | 8,161,261.53 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය සහ අධීක්ෂණය, ළමා අපයෝජන වැළැක්වීම සහ පසු විපරම් | 11,116,560.25 | 8,960,902.59 |
| ළමා අපයෝජන පැමිණිලි භාර ගැනීම සහ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | 3,845,328.36 | 2,142,984.20 |
| ළමුන්ට එරෙහි සහසිකත්වයට අදාළ දැනුම මෙහෙයවීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම | 341,708.50 | 61,825.75 |
| සුනාමි ආපදා සහන වැඩසටහන පැවැත්වීම | 568,665.00 | 1,088,037.20 |
| ළමා ආරක්ෂාව සඳහා සංවර්ධන වැඩසටහන්, වැඩමුළු, සාකච්ඡා සහ අනෙකුත් දෑ. | 1,384,507.95 | 1,681,749.50 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සේවකයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ නඩත්තු කටයුතු | 828,492.00 | 2,454,751.50 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ළමුන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන් | - | 825,000.00 |
| පැය 24 ගාස්තු රහිත ළමා උපකාරක දුරකථන සේවා ක්‍රියාකාරී සැලැස්ම | - | 2,782,000.00 |
| එකතුව | **34,132,932.21** | **29,784,665.40** |

| සටහන් 4 | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| **ව්‍යාපෘති වියදම්** | | |
| UNICEF ක්‍රියාකාරී සැලස්ම | 3,141,750.00 | - |
| සිතුවිලි සිත්තම් වියදම් | 410,413.00 | 36,612.00 |
| සුනාමි අනුග්‍රාහක දීමනා ඩේලි මිරර් | 405,000.00 | 400,000.00 |
| **එකතුව** | **3,957,163.00** | **436,612.00** |

| සටහන 5 | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| **ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම්** | | |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ ගෙවීම් | 839,884.94 | - |
| **එකතුව** | **839,884.94** | **-** |

| සටහන 6 | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| **මූල්‍ය වියදම්** | | |
| බැංකු ගාස්තු | 530.73 | - |
| **එකතුව** | **530.73** | **-** |

| සටහන 7 | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| **කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)** | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය) - මහා භාණ්ඩාගාරය | (10,938,775.15) | (10,458,527.42) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) - ව්‍යාපෘති | - | - |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ ජාතික ළමා ආරක්ෂක අරමුදල | (402,455.80) | 202,943.76 |
| **එකතුව** | **(11,341,230.95)** | **(10,255,583.66)** |

| සටහන 8 | | | | | රු. |
|---|---|---|---|---|---|
| **දේපළ, පිරියත සහ උපකරණ** | **2023/1/1 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **එකතු කිරීම** | **ඉවත් කිරීම** | **පූර්ව වර්ෂයේ ගැලපීම** | **2023/12/31 දිනට පහළට ගෙනා ශේෂය** |
| **පිරිවැය / තක්සේරු කිරීම** | | | | | |
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරිය** | | | | | |
| ගොඩනැගිලි | 136,375,875.00 | - | - | - | 136,375,875.00 |
| මෝටර් රථ | 48,445,000.00 | - | - | - | 48,445,000.00 |
| ගෘහ භාණ්ඩ | 17,665,309.87 | 225,832.50 | - | 1,481,639.00 | 19,372,781.37 |
| උපකරණ | 61,827,329.49 | 471,923.53 | (12,465.00) | 2,261,416.00 | 64,548,204.02 |
| | **264,313,514.36** | **697,756.03** | **(12,465.00)** | **3,743,055.00** | **268,741,860.39** |
| **ව්‍යාපෘතිවලින් ලත් ස්ථාවර වත්කම්** | | | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 501,446.00 | - | - | - | 501,446.00 |
| ILO - ළමා ජාවාරම් වැළැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 754,701.00 | - | - | - | 754,701.00 |
| ILO - පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 6,969.00 | - | - | - | 6,969.00 |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 2,232,158.65 | - | - | - | 2,232,158.65 |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 1,035,193.00 | - | - | - | 1,035,193.00 |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 96,275.00 | - | - | - | 96,275.00 |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 1,079,182.89 | - | (342,550.00) | - | 736,632.89 |
| SAIEVAC ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහ භාණ්ඩ | 79,147.50 | - | - | - | 79,147.50 |
| - උපකරණ | 85,757.00 | - | - | - | 85,757.00 |
| UNDP ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහ භාණ්ඩ | 33,112.80 | - | - | - | 33,112.80 |
| - උපකරණ | 1,782,665.28 | - | - | - | 1,782,665.28 |
| UNICEF ව්‍යාපෘතිය | | | | | |
| - මෝටර් රථ | 8,378,609.00 | - | - | - | 8,378,609.00 |
| - උපකරණ | 11,028,244.68 | - | - | - | 11,028,244.68 |
| GIZ - මෝටර් රථ | 2,113,000.00 | - | - | - | 2,113,000.00 |
| SAVE THE CHILDREN - උපකරණ | 133,980.00 | - | - | - | 133,980.00 |
| | **29,340,441.80** | - | **(342,550.00)** | - | **28,997,891.80** |
| **එකතුව** | **293,653,956.16** | **697,756.03** | **(355,015.00)** | **3,743,055.00** | **297,739,752.19** |

| සටහන 8 තවදුරටත් | | | | | රු. |
|---|---|---|---|---|---|
| ක්ෂය වෙන් කිරීම | 2023/1/1 දිනට ඉදිරියට ගෙනා ශේෂය | 2023 වසර සඳහා ක්ෂය ප්‍රතිපාදන | ඉවත්කිරීම | පූර්ව වර්ෂයේ ගැලපීම් | 2023/12/31 දිනට පහළට ගෙනා ශේෂය |
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරිය** | | | | | |
| ගොඩනැගිලි | - | 2,727,517.50 | - | - | 2,727,517.50 |
| මෝටර්රථ | 16,505,166.00 | 4,844,500.00 | - | - | 21,349,666.00 |
| ගෘහ භාණ්ඩ | 14,563,456.08 | 1,007,277.02 | - | 168,054.40 | 15,738,787.50 |
| උපකරණ | 51,942,886.50 | 3,060,358.66 | (12,465.00) | 165,300.12 | 55,156,080.28 |
| | **83,011,508.58** | **11,639,653.18** | **(12,465.00)** | **333,354.52** | **94,972,051.28** |
| **ව්‍යාපෘතිවලින් ලත් ස්ථාවර වත්කම්** | | | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 501,446.00 | - | - | - | 501,446.00 |
| ILO ළමා ජාවාරම් වැලැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 754,701.00 | - | - | - | 754,701.00 |
| ILO පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 6,969.00 | - | - | - | 6,969.00 |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 2,232,158.65 | - | - | - | 2,232,158.65 |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 1,035,193.00 | - | - | - | 1,035,193.00 |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 96,275.00 | - | - | - | 96,275.00 |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 1,079,182.89 | - | (342,550.00) | - | 736,632.89 |
| SAIEVAC ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහ භාණ්ඩ | 79,147.50 | - | - | - | 79,147.50 |
| - උපකරණ | 83,757.00 | 750.00 | - | - | 84,507.00 |
| UNDP ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහ භාණ්ඩ | 33,112.80 | - | - | - | 33,112.80 |
| - උපකරණ | 267,399.79 | 267,399.79 | - | - | 534,799.58 |
| UNICEF ව්‍යාපෘතිය | | | | | |
| - මෝටර්රථ | 3,027,609.00 | 660,300.00 | - | - | 3,687,909.00 |
| - උපකරණ | 8,531,876.13 | 748,609.09 | - | - | 9,280,485.22 |
| GIZ - මෝටර්රථ | 2,113,000.00 | - | - | - | 2,113,000.00 |
| SAVE THE CHILDREN - උපකරණ | 51,834.89 | 20,097.00 | - | - | 71,931.89 |
| | **19,893,662.65** | **1,697,155.88** | **(342,550.00)** | - | **21,248,268.53** |
| **එකතුව** | **102,905,171.23** | **13,336,809.06** | **(355,015.00)** | **333,354.52** | **116,220,319.81** |

| සටහන 8 තවදුරටත්. | | | රු. |
|---|---|---|---|
| ශුද්ධ පොත් අගයන් | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ පොත් අගය |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | | | |
| ගොඩනැගිලි | 136,375,875.00 | 2,727,517.50 | 133,648,357.50 |
| මෝටර්රථ | 48,445,000.00 | 21,349,666.00 | 27,095,334.00 |
| ගෘහ භාණ්ඩ | 19,372,781.37 | 15,738,787.50 | 3,633,993.87 |
| උපකරණ | 64,548,204.02 | 55,156,080.28 | 9,392,123.74 |
| | **268,741,860.39** | **94,972,051.28** | **173,769,809.11** |
| ව්‍යාපෘතිවලින් ලත් ස්ථාවර වත්කම් | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 501,446.00 | 501,446.00 | - |
| ILO ළමා ජාවාරම් වැලැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 754,701.00 | 754,701.00 | - |
| ILO පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 6,969.00 | 6,969.00 | - |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 2,232,158.65 | 2,232,158.65 | - |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 1,035,193.00 | 1,035,193.00 | - |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 96,275.00 | 96,275.00 | - |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 736,632.89 | 736,632.89 | - |
| SAIEVAC ව්‍යාපෘතිය | | | |
| - ගෘහ භාණ්ඩ | 79,147.50 | 79,147.50 | - |
| - උපකරණ | 85,757.00 | 84,507.00 | 1,250.00 |
| UNDP ව්‍යාපෘතිය | | | |
| - ගෘහ භාණ්ඩ | 33,112.80 | 33,112.80 | - |
| - උපකරණ | 1,782,665.28 | 534,799.58 | 1,247,865.70 |
| UNICEF ව්‍යාපෘතිය | | | |
| - මෝටර් රථ | 8,378,609.00 | 3,687,909.00 | 4,690,700.00 |
| - උපකරණ | 11,028,244.68 | 9,280,485.22 | 1,747,759.46 |
| GIZ - මෝටර් රථ | 2,113,000.00 | 2,113,000.00 | - |
| SAVE THE CHILDREN - උපකරණ | 133,980.00 | 71,931.89 | 62,048.11 |
| | **28,997,891.80** | **21,248,268.53** | **7,749,623.27** |
| **එකතුව** | **297,739,752.19** | **116,220,319.81** | **181,519,432.38** |

සටහන 8.1

| කල්බදු දේපළ | කල් බදු කාල පරිච්ඡේදය (වර්ෂ) | බදු පිරිවැය | පසුගිය වර්ෂය සඳහා සමුච්චිත ක්‍රමක්ෂය | ඉදිරියට ගෙනා ශේෂය | 2023 වර්ෂය සඳහා ක්‍රමක්ෂය වෙන් කිරීම | පහළට ගෙනා ශේෂය |
|---|---|---|---|---|---|---|
| කල්බදු දේපළ (2000) | 50 | 8,422,459.89 | 3,874,331.56 | 4,548,128.33 | 168,449.20 | **4,379,679.13** |
| කල්බදු දේපළ (2016) | 30 | 18,317,757.08 | 4,274,143.30 | 14,043,613.78 | 610,591.90 | **13,433,021.88** |
| | | **26,740,216.97** | **8,148,474.86** | **18,591,742.11** | **779,041.10** | **17,812,701.01** |

| සටහන 9 | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **දිගු කාලීන ලැබීම්** | | |
| ආපදා ණය | 2,425,739.83 | 1,969,607.45 |
| **එකතුව** | **2,425,739.83** | **1,969,607.45** |

| සටහන 10 | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **ආයෝජන සහ ඉතිරි කිරීම්** | | |
| පාරිතෝෂිත අරමුදල් ආයෝජන ගිණුම - 261605 | 476,574.23 | 231,037.56 |
| සුනාමි ඉතුරුම් ගිණුම - 679016 | 64,004.18 | 62,393.29 |
| ආපදා ණය ඉතුරුම් ගිණුම - 89945554 | 541,534.89 | 238,066.39 |
| ස්ථාවර තැන්පතු | 8,265,387.95 | 7,501,169.21 |
| **එකතුව** | **9,347,501.25** | **8,032,666.45** |

| සටහන 11 | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|
| **ලැබිය යුතු ගිණුම්** | | |
| උත්සව අත්තිකාරම් | 135,250.00 | 156,750.00 |
| මුදල් අත්තිකාරම් | 1,558,700.05 | 2,103,641.19 |
| ලැබිය යුතු ගිණුම් | 162,681.00 | 186,371.63 |
| ලැබිය යුතු ආපදා ණය | 714,569.53 | 461,908.21 |
| ලැබිය යුතු - ළමා ආරක්ෂක අරමුදල | 410,413.00 | 16,943.01 |
| **එකතුව** | **2,981,613.58** | **2,925,614.04** |

| සටහන 12 | රු. 2023 | රු. 2022 |
|---|---|---|
| **පූර්ව ගෙවීම්** | | |
| රක්ෂණය | 137,110.20 | 366,228.37 |
| සේවා ගිවිසුම | 255,682.65 | 274,575.52 |
| **එකතුව** | **392,792.85** | **640,803.89** |

| සටහන 13 | රු. 2023 | රු. 2022 |
|---|---|---|
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව -ජංගම ගිණුම 228076 | 3,019,423.97 | 4,806,172.21 |
| - ජංගම ගිණුම 71252941 | 504,848.14 | 843,270.01 |
| මහජන බැංකුව -ජංගම ගිණුම 174-1-001-4-0347385 | 160,524.74 | 541,524.74 |
| **එකතුව** | **3,684,796.85** | **6,190,966.96** |

සටහන - 14 A

ව්‍යාපෘති අරමුදල් ශේෂ -විස්තරය

රු.

| ව්‍යාපෘතියේ නම | ඉදිරියට ගෙනා ශේෂය | පූර්ව වර්ෂයේ ගැලපීම් | 2023 | | පහළට ගෙනා ශේෂය |
|---|---|---|---|---|---|
| | | | අරමුදල්/ලැබීම් | වියදම් | |
| සුනාමි අනුග්‍රාකත්වය - Daily Mirror | 541,524.74 | - | 24,000.00 | (405,000.00) | 160,524.74 |
| Child Fund | 504,300.53 | - | - | - | 504,300.53 |
| මහජන බැංකුව | 410,413.00 | - | - | (410,413.00) | - |
| UNICEF අරමුදල | - | - | 3,354,000.00 | (3,141,750.00) | 212,250.00 |
| එකතුව | **1,456,238.27** | **-** | **3,378,000.00** | **(3,957,163.00)** | **877,075.27** |

සටහන **-14 B**
**ළමා ආරක්ෂක අරමුදල -ගිණුම් සාරාංශය**

රු.

| අරමුදලේ නම | ඉදිරියට ගෙනා ශේෂය | පූර්ව වර්ෂය | ලැබීම් ( සටහන- 1C) | වියදම් (සටහන 12) | අතිරික්තය/(හිඟය) 2023 වසර සඳහා | පහළට ගෙනා ශේෂය |
|---|---|---|---|---|---|---|
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 2,095,500.24 | - | 437,429.14 | (839,884.94) | (402,455.80) | 1,693,044.44 |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 15** | **2023** | **2022** |
| **උපචිත වියදම්** | | |
| අතිකාල | 178,989.40 | 171,037.06 |
| ආරක්ෂක සේවා | 434,523.73 | 297,122.96 |
| සනිපාරක්ෂක සේවා | 174,526.60 | 141,060.00 |
| E.P.F. ගෙවීම් | 478,293.00 | - |
| E.T.F. ගෙවීම් | 71,743.95 | - |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා | 661,650.91 | 810,704.38 |
| විදුලි වියදම් | 502,960.69 | 233,846.50 |
| ජලය | 7,263.02 | 4,628.93 |
| ලිපි ද්‍රව්‍ය | - | 48,250.00 |
| ළමා ආරක්ෂක අරමුදලෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ගෙවීම් | 410,413.00 | 16,943.01 |
| දුරකථන වියදම් | 429,741.98 | 437,604.73 |
| විවිධ ණය හිමියෝ | 2,600,427.14 | 577,400.00 |
| වෙබ් අඩවි නඩත්තුව | 27,024.96 | 26,214.24 |
| පුවත්පත් වියදම් | 28,790.00 | 28,100.00 |
| නිවාඩු දින ගෙවීම් | 2,564.25 | - |
| ආධුනිකයන් පුහුණු කිරීම සඳහා දීමනා | 73,750.00 | 72,500.00 |
| බදු ගෙවීම | 1,469,990.32 | - |
| ගෙවිය යුතු වැටුප් | 1,176,458.62 | - |
| **එකතුව** | **8,729,111.57** | **2,865,411.81** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 16** | **2023** | **2022** |
| **කෙටි කාලීන වෙන් කිරීම්** | | |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | 476,100.00 | 450,000.00 |
| කෙටි කාලීන පාරිතෝෂික අරමුදල් සඳහා වෙන් කිරීම් | 474,793.50 | 816,153.50 |
| **එකතුව** | **950,893.50** | **1,266,153.50** |

රු.

| සටහන 17 | **2023/1/1** දිනට ඉදිරියට ගෙනා ශේෂය | **2023** වසර සඳහා ලැබීම් | **2023** වසර සඳහා වියදම් | පූර්ව වර්ෂයේ ගැලපීම් | **2023/12/31** දිනට පහළට ගෙනා ශේෂයප |
|---|---|---|---|---|---|
| **යෙදවූ ප්‍රාග්ධනය** | | | | | |
| **ප්‍රාග්ධන ප්‍රදාන** | | | | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 15,398,565.63 | 697,756.03 | (4,443,024.20) | 1,412,310.25 | 13,065,607.71 |
| UNICEF - ප්‍රදාන | 2,666,468.55 | - | (805,309.09) | - | 1,861,159.46 |
| UNDP - ප්‍රාග්ධන ප්‍රදාන | 1,515,265.49 | - | (267,399.79) | - | 1,247,865.70 |
| ප්‍රාග්ධන ප්‍රදාන - වත්කම් අත්පත් කර ගැනීමේ/සංවර්ධනය කිරීමේ කටයුතු | 8,251.25 | - | (4,950.75) | - | 3,300.50 |
| ප්‍රාග්ධන ප්‍රදාන - කල්බදු දේපළ | 14,043,613.77 | - | (610,591.90) | - | 13,433,021.87 |
| SAVE THE CHILDREN - ප්‍රාග්ධන ප්‍රදාන | 82,145.11 | - | (20,097.00) | - | 62,048.11 |
| අමාත්‍යාංශ ප්‍රදාන (ප්‍රාග්ධන අත්පත් කර ගැනීම් ) | 3,108,628.00 | - | (920,857.17) | - | 2,187,770.83 |
| ජනාධිපති කාර්යාලය විසින් ලබාදුන් මෝටර් රථ | 5,134,167.00 | - | (610,000.00) | - | 4,524,167.00 |
| ප්‍රාග්ධන ප්‍රදාන - ICTA | - | - | (130,108.87) | 2,261,416.00 | 2,131,307.14 |
| **එකතුව** | **41,957,104.80** | **697,756.03** | **(7,812,338.77)** | **3,673,726.25** | **38,516,248.32** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VOT/B/NCPA/01/2023/20 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 ජුනි 11 දින

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 52 හා 53 ඡේදවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රත්‍යාගණන සංචිත ගිණුමෙන් රු. 6,303,511ක් විලම්භිත ආදායම් ලෙස මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයට බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි..

(ආ) සේවයෙන් ඉවත් වූ නිළධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.474,794 ක් පාරිතෝෂික ලෙස වෙන් කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ඌණතාවය සහ පාරිතෝෂික වෙන් කිරීම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.3,909,000ක් (ශ්‍රිතානය පවුම් 10,000 ) වටිනාකමැති ළමා අපයෝජන වාර්තා කිරීම සඳහා වන අන්තර්ජාල ද්වාර මෘදුකාංගය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් සංවර්ධනය කර ලබා දී තිබුණු රු.1,461,961 ක් වූ දත්ත පද්ධතිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබුණු රු.2,568,680 ක් වටිනා පාසල් ලිපිද්‍රව්‍ය අදාල ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීම සනාථ කිරීමට අදාල ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) (i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ලද ද්‍රව්‍යමය ව්‍යාපෘති ආධාර රු.3,378,000 ක් මුදල් ගලා ඒමක් ලෙස හඳුනාගෙන තිබීමෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.697,756 ක් මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම වෙනුවට රු.3,440,856 ක් මුදල් ගලා යාමක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන්, රු.760,612 කින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ විලම්බිත ආදායම රු.14,115,850ක් වුවද එය රු.10,260,674ක් ලෙස හා පෙර වර්ෂයේ ලද රු.3,253,206ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂයේ ඌනතාවයට ගැලපීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.601,969ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයතුලදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික (ICT) නියෝජිත ආයතනයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.2,261,416ක් වටිනා උපකරණ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පරිත්‍යාග ලැබීම් ලෙස මුළු වටිනාකම් ගිණුම්ගත කළ යුතු වුවද ඉන් රු.130,108ක් විලම්භිත ආදායම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට හා රු.2,131,307ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙසත් ගිණුම්ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍යවේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

  භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 [illegible]ගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට [illegible] කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 [illegible] අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව [illegible] පාලක මණ්ඩලයේ [illegible] සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධව යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
| --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි අංක 371(5) | සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා 67 කදී ලබා දුන් එකතුව රු.1,558,700ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවා නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| **බලතල, කර්තව්‍ය, කාර්යයන්** | **නිරීක්ෂණ** |
| --- | --- |
| 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත<br>(අ) 14 (ඊ) වගන්තිය | ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී තිබුණද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසන් දිනය දක්වාම අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් අදාල ජාතික මෙහෙයුම් කමිටුව, පළාත් කමිටු, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු ස්වාධීන තාක්ෂණික කව ලෙස ස්ථාපනය සහ පැවැත්වීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. |
| (ආ) 14 (ඍ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුලදී ළමා අපයෝජන නඩු කටයතු පිළිබඳ නීති අංශය විසින් කැඳවන ලද තොරතුරු පොලිස් ස්ථාන 96කින් ලැබී නොතිබුණි. තවද ළමා අපචාර සම්බන්ධ නඩු කටයුතු නියාමනය කිරීමේ කට ;තු සිදු කිරීමට අධිකාරියේ නීති අංශය ආපාහොසත්වී තිබුණි. |

(ඇ) 14 (ඉ), (ඔ), (උ) වගන්ති

2011 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දිනය දක්වා අධිකාරියට ළමා අපචාර සම්බන්ධයෙන් පැමිණිලි 123,732 ක් ලැබී තිබූ අතර, ඉන් පැමිණිලි 52,922 ක් එනම් සියයට 43 ක් තවදුරටත් විමර්ශනය වෙමින් පැවතුණි. එබැවින් ළමා අපචාර වලට ගොදුරු වූ ළමුන් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීමේ ක්‍රියාවලිය ළමයා වැඩිහිටියෙක් බවට පත්වීමට ප්‍රථම අවසන් කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සැකසීමට අධිකාරිය සතු වගවීම ඉටුකිරීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි.

ළමා අපචාර සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන්ගේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීමත් රට තුළ දිනෙන් දින වර්ධනය වන ළමා අපචාර වැළැක්වීම සම්බන්ධයෙන් අධිකාරියෙහි නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවීමත් තවදුරටත් නොවිසිඳුණු පැමිණිලි විශාල ලෙස වර්ධනය වීමට හේතු වී තිබුණි.

(ඇ) 14 (ක) වගන්තිය

දත්ත පද්ධතිය ස්ථාපනය කර ළමා අපචාර සම්බන්ධයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා පොලිසිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ රෛඛීය අමාත්‍යාංශය අතර විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීමට මේ දක්වා කටයුතු නොකිරීම හේතුවෙන් දිවයිනෙන් ලැබෙන ළමා අපචාර සම්බන්ධ පැමිණිලි කොපමණද යන්න හා එම පැමිණිලිවල වර්තමාන ප්‍රගතිය සම්බන්ධව සොයා බලා තහවුරු කිරීමට අධිකාරියට නොහැකි තත්වයක් පවතින බව විගණනයේදී අනාවරණය විය.

(ඉ) 14 (ඒ) වගන්තිය

- පළාත් මට්ටමින් වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක ආරම්භ කිරීම සඳහා 2021 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලබා දී තිබුණද මෙම වාර්තාවේ දිනය දක්වාම පළාත් 7ක වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. දකුණු පළාතේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය 2013 වර්ෂයේ ආරම්භ කර තිබුණද, පැවති අඩුපාඩු හේතුවෙන් 2015 වර්ෂයේ සිටම මෙම ඒකකය සහ ලද තාක්ෂණික උපකරණ නිෂ්කාර්යව පවතින අතර නැවත එම තාක්ෂණික උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමට රු.7,760,500ක් ඇස්තමේන්තුකර තිබුණි.
- නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මාර්ගෝපදේශයේ 2.5 වගන්තිය ප්‍රකාරව වින්දිත ළමයින්ට නවාතැන් පහසුකම් ලබා ගැනීම සඳහා ආරක්ෂිත

නිවාසයක් (safe house) වාර්තාවේ දිනය දක්වාම අධිකාරිය විසින් පවත්වාගෙන යාමට අපොහොසත්වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඵ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

(අ) 2014 වර්ෂයේ සිට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට භාවිතයට ගන්නා ලෙස වාචිකව පවරන ලද මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල වාර්තාවේ දිනය දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණු අතර මෙම ගොඩනැගිල්ලේ ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පමණක් රු.1,084,684 ක් වැය කර තිබුණි.

(ආ) ජාතික ළමා ආරක්ෂක අධිකාරියට යාබද ඉඩම රු.18,317,757 ක වටිනාකමකට 2016 වර්ෂයේදී වර්ෂ 30ක කල් බදු පදනම සඳහා ලබාගෙන තිබුණද එම ඉඩම වාර්තාවේ දිනය දක්වාම කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) අධිකාරියේ සහකාර කළමණාකරු (වැඩසටහන්) වසර 12 කට අධික කාලයක සිට බාහිර ආයතන සඳහා මුදා හැර තිබීම හේතුවෙන් මෙම තනතුර මඟින් ඉටු විය යුතු කාර්යයන් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2016 ජනවාරි 25 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට පටහැනිව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විමර්ශන නිලධාරී, කළමනාකරු (සැලසුම් හා තොරතුරු),තොරතුරු හා තාක්ෂණික සහායක තනතුර, කළමනාකරු වැඩසටහන්, සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය හා තොරතුරු) යන තනතුරු සඳහා අවම මූලික සුදුසුකම් නොමැති නිලධාරීන් බඳවා ගැනීම සිදු කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රම රත්න

විගණකාධිපති